# රණවරුණ

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ ප්‍රකාශනයකි

24 වන කලාපය
2017 - මැයි, ජුලි

ස්වේච්ඡා බළසේනාවේ අනාගතය භාරවනුයේ ඊට අලුතින් එක්වන තරුණ කොටස් වෙතය. වසර 136 ක් ගතවූ එහි ඓතිහාසික ගමන් මගට ශක්තියක් වෙමින් නිළධාරීන් හා සෙබලුන් ලෙස එක්වන ඔවුන් තවත් දශක ගණනාවක් එකී අභිමානය පෙරට ගෙනයනු නියතය.

පසුගියදා ස්වේච්ඡා පාඨමාලා අංක 58 ට අයත් කෙඩෙට් නිලධාරීන්ගේ පුහුණුවීම් දියතලාව යුද හමුදා විද්‍යාපීඨයේදී ආරම්භ වෙද්දී, ඊට සමගාමීව ස්වේච්ඡා බළසේනාවට එක්වන ආධුනික සෙබල පාඨමාලා රැසක්ද දෙහිඅත්තකණ්ඩිය, හේනානිගල, නුවරඑළිය ආදී ප්‍රදේශ කීපයකම ක්‍රියාත්මක වේ. එකී ජව බළ පිරි තාරුණ්‍යයේ අභිමානයෙන් මෙවර පිටකවරය සැරසේ...



## උතුම් මෙහෙයට පුතුන් එක්වූ වගයි ...

2017 මැයි - ජූලි
ISBN 1800 -4792


# මේ අවදානමෙන් මිදෙමු...

"ඩෙංගු" රෝගය අදවන විට රට තුළ දැවෙන ප්‍රශ්නයක් බවට පත්ව ඇත. දිනපතා ඊට ගොදුරුවන පිරිස වැඩිවෙමින් පවතින අතර ඒ හේතුවෙන් මියගිය සංඛ්‍යාවද සියගණනකි. ජාති ආගම් බේදයකින් තොරව පුද්ගල තරාතිරම නොබලා මෙම ව්‍යසනයේ බලපෑම එල්ල වී තිබේ.

"ඩෙංගු" වලින් වැලකීමේ ක්‍රමවේද හා මෙම රෝගය පැතිරයාම වැලැක්වීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව කොතෙකුත් දැනුවත් කලද ජනතාව අතර එය එතරම් සැලකිල්ලට භාජනය වන සෙයක් නොපෙනේ. මෙහි තවත් අවාසනාවන්ත කරුණක් ව ඇත්තේ යුද හමුදා කඳවුරු ආශ්‍රිතවද "ඩෙංගු" රෝගය සැලකිය යුතු ලෙස ඉහල ගොස් තිබීමය.

පසුගිය කාලසීමාව තුළ දිවයින පුරා පිහිටි යුද හමුදා රෝහල් පිරීයන තරමට හමුදා සාමාජිකයින් අතර මෙම රෝගය පැතිරී තිබේ. යුද හමුදාව වැනි විනයක්, පාලනයක්, පිළිවෙලක් සහිත තැන්වලද "ඩෙංගු" අවධානම පැතිර යාම කිසිසේත්ම සුලුකොට තැකිය හැක්කක් නොවේ. ඒබැවින් කඳවුරු ආශ්‍රිතව "ඩෙංගු" ව්‍යාප්තිය වැලැක්වීම සඳහා වූ වැඩපිළිවෙල මීට වඩා ක්‍රමවත් කලයුතුව ඇත. ත්‍රස්තවාදයට එරෙහි සටනේදී පවා තමදිවි රැකගත් රණවිරුවන් මෙවැනි රෝගයක් හේතුවෙන් ජීවිත අවධානමකට ලක්වේනම් කොතරම් අභාග්‍යයක්ද.?

සිවිල් සමාජයට වඩා ක්‍රමවත්ව හා සැලසුම් සහගත ලෙස ඕනෑම කටයුත්තක් සංවිධානය කිරිමේ හැකියාව යුද හමුදාව සතුය. එබැවින් "ඩෙංගු" මර්දනය පිණිස වූ වැඩසටහන්ද හමුදාවක් ලෙස සාමුහිකව මනා සැලසුමකින් ක්‍රියාත්මක කර රටටම ආදර්ශයක් ලබාදීම වැදගත්ය. තිස්වසක ත්‍රස්තවාදය මුලිනුපුටා දැමූ අයුරු පූර්වාදර්ශයක් කොට ගනිමින් "ඩෙංගු" උවදුරද සමස්ථ රටෙන්ම තුරන් කරලීමට අපි සැවොම කැපවෙමු.



# ඇතුළු පිටු

06 / එස් 5 සංකල්පය ප්‍රායෝගික කරවමින්
24 / ආධ්‍යාත්මික සුව පතා
12 / අදහන්න එය ඔබටත් කළ හැකි බව විශ්වාස කරන්න
26 / විශිෂ්ඨයන් අතර විශිෂ්ඨයෙකු වී
15 / මේ නගරය
28 / කිසාගෝතමිය
20 / එකක අබිමන් සමරමින්
38 / කපිතාන් අලදෙනිය හැබැහින් දකිමු

**ප්‍රකාශනය**
**ශ්‍රී ලංකා යුද්ධ හමුදා**
**ස්වේච්ඡා බළසේනා මුලස්ථානය**

**උපදේශක මණ්ඩලය**
බ්‍රිගේඩියර් ඩබ්ලිව්එච්ඩී මහානාද
බ්‍රිගේඩියර් එල්එෆ් කස්තුරිආරච්චි
කර්නල් එම්ජීඒ්එන්බී මහතුවක්කාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී

**සංස්කාරක**
මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ ශ්‍රීලයුපොදුසේබ

**'රණවරුණ" කාර්ය මණ්ඩලය**
ලුතිතන් එච්පීඑම්පීබීඑම් පළිහක්කාර ශ්‍රීලංජාආබමු
ලා/කෝප්‍රල් සුජීව කුමාර කෝවිලතැන්න (සැකසුම් සහය)
බනි II සුසිරිපාල ඩබ්ලිව්එම්
කෝප්‍රල් නන්දසිරි බීජීඑල්
කෝප්‍රල් කුමාර පීඩබ්ලිව්ඩබ්ලිව්පීඑස්එම්
ලා/කෝප්‍රල් සාලිය බණ්ඩාර යූඕඒ
ලා/කෝප්‍රල් චාමර එම්කේආර්එල්
ලා/කෝප්‍රල් කීර්තිරත්න ඒඑම්ටීඑස්
සාසෙ බොතේජු පීඩබ්ලිව්ඩබ්ලිව්
සාසෙ පෙරේරා එච්ආර්පීඩබ්ලිව්

**රණවරුණ ලිපිනය**
සංස්කාරක
රණවරුණ
ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ස්වේච්ඡා බළසේනා මුලස්ථානය
යුද හමුදා කඳවුර
සාලාව - කොස්ගම

ඊමේල් **ranawaruna@yahoo.com**
දුරකතන - 036 2255 362
ෆැක්ස් - 036 2255 709

**පරිගණක නිර්මාණය හා මුද්‍රණය**
නියෝ ග්‍රැෆික්ස්

## එළැඹි සුභ මොහොතේ

# නව තනතුරෙහි වැඩ ඇරඹූ වගයි...







ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 22 වන යුද්ධ හමුදාධිපති ලෙස ලුතිතන් ජෙනරාල් එන්යුඑම්එම්ඩබ්ලිව් සේනානායක ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී, යූඑස්පී, පීඑස්සී ඉකුත් ජූලි මස 05 දින සුබමොහොතින් සිය තනතුරෙහි වැඩ භාරගන්නා ලදී. ඒ නිමිත්තෙන් යුද්ධ හමුදා මූලස්ථානයේ ආගමික වතාවත්වලට මුල්තැන දෙමින් අභිමානවත්ව සංවිධානය කෙරුණු උත්සවයේ විචිත්‍ර මතක සටහන් වලින් මෙම පිටුව වර්ණවත් වේ.

# යුද හමුදා ස්වේච්ඡා බළසේනා
# අත්පන්දු හා දැල්පන්දු ශූරතාවලිය - 2017

යුද හමුදා ස්වේච්ඡා බළසේනා මුලස්ථානය මගින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන අන්තර් රෙජිමේන්තු වොලිබොල් හා නෙට්බෝල් තරඟාවලිය ඉකුත් ජුනි මස 23 දින සිට 25 දින දක්වා මහරගම තරුණසේවා සභා ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී පැවැත්විණ.

එහි සමාරම්භක උත්සවය සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක බ්‍රිගේඩියර් ඩබ්එච්ඩී මහානාද සහභාගි වූ අතර, එහි අවසන් දින ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් එම්එච්එස් බොනිෆස් පෙරේරා ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී, යූඑස්පී, එන්ඩීයු, පීඑස්සී එක්විය.

තෙදිනක් පුරා පැවැත්වූ මෙම තරඟාවලියට පිරිමි කණ්ඩායම් 21 ක් හා කාන්තා කණ්ඩායම් 06 ක් වොලිබොල් ශූරතාවය සඳහාද, කාන්තා කණ්ඩායම් 06 ක් නෙට්බෝල් ශූරතාවය සඳහාද තරඟ වැදුනහ. එහිදී වොලිබෝල් පිරිමි ශූරතාවය ශ්‍රී ලංකා පාබල හමුදා කණ්ඩායමද අනුශූරතාවය ඉංජිනේරු සේවා රෙජිමේන්තු කණ්ඩායමද හිමිකර ගත්හ. එහි කාන්තා ශූරතාවය 6(සෙව්) කාන්තා බලකායටද අනුශූරතාවය 4(සෙව්)කාන්තා බලකායටද හිමිවිය. 2017 ස්වේච්ඡා බළසේනා නෙට්බෝල් ශූරතාවය හිමිකර ගන්නා ලද්දේ 6(සෙව්) කාන්තා බලකාය විසිනි. එහි අනුශූරතාවය දිනාගැනීමට 4(සෙව්) කාන්තා බලකාය සමත්විය.

ස්වේච්ඡා බළසේනාවට අයත් ඒකක නියෝජනය කරන සියලු රෙජිමේන්තුවල ක්‍රීඩක ක්‍රීඩිකාවන් විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් සංවිධානය කෙරුණු මෙවර තරඟාවලිය අතිශය විචිත්‍රවූත් තරඟකාරීවූත් ඒකක් විය.























NETBALL QUEEN



# එස් 5 සංකල්පය
# ප්‍රායෝගික කරවමින්

ස්වේච්ඡා බළසේනා සාමාජිකයින් තුළ යහපත් නිරවුල් මානසිකත්වයක් ඇති කොට ඔවුන්ගේ වෘත්තිය ඵලදායිතාවය වර්ධනය කිරීම අද වනවිට කාලීන අවශ්‍යතාවක්ව ඇත. එකී අරමුණ පෙරදැරිව ස්වේච්ඡා බළසේනා සේනාවිධායකගේ උපදෙස් හා මගපෙන්වීම මත ස්වේච්ඡා බළසේනා මුලස්ථාන ශාඛා අංශ අතර මෙන්ම ස්වේච්ඡා ඒකක හා ස්වේච්ඡා පුහුණු පාසල් අතර එස් 5 සංකල්පය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරවීමේ තරඟාවලියක් දියත් කරන ලදී.



ස්වේච්ඡා බළසේනා මුලස්ථානයේ සංවිධායකත්වයෙන් පැවැති එම තරඟාවලියෙහිදී එස් 5 සංකල්පය සාර්ථකව ක්‍රියාත්මක කළ බළඇණි අතර තෙවන ස්ථානය 5(සෙව්) ශ්‍රීලංසිරෙ ඒකකයද, දෙවන ස්ථානය 15 (සෙව්) ගැහේබ ඒකකයද, ප්‍රථම ස්ථානය 19 (සෙව්) ශ්‍රීලංසිරෙ ඒකකයද සම්මාන හිමිකර ගන්නා ලදී. එසේම ස්වේච්ඡා බළසේනා මුලස්ථාන ශාඛා/අංශ අතර තරඟාවලියේ ප්‍රථම ස්ථානය ප්‍රධාන ශාඛාව විසින් දිනාගැනීමට සමත් විය.









ස්වේච්ඡා බළසේනා පුහුණු පරීක්ෂක බ්‍රිගේඩියර් එල්එෆ් කස්තුරිආරච්චි ගේ ප්‍රධානත්වයෙන් පත්කළ විශේෂ මණ්ඩලයක් මගින් ඒ ඒ ඒකක පුද්ගලිකව පරීක්ෂාවට භාජනය කොට අදාළ ජයග්‍රාහකයින් තෝරාගැනීම සිදු කෙරිණ.



ජයග්‍රාහී ඒකක හා ශාඛා අංශ වෙත සම්මාන සහතික පිළිගැන්වීම ස්වේච්ඡා බළසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් එම්එච්එස්බී පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී අතින් සිදුකෙරුණු අතර, සම්මාන ප්‍රදානෝත්සවයට සමගාමීව සිංගප්පූරුවේ තාක්ෂණ හා සැළසුම් විශ්ව විද්‍යාලයේ මහාචාර්ය සුරංග නානායක්කාර මහතා විසින් විශේෂ දේශනයක් ද සිදුකරන ලදී.



# පොසොන් සඳයි
# සිල් සුවඳයි

යුද හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානයේ මූලිකත්වයෙන් වාර්ෂිකව සංවිධානය කරණු ලබන පොසොන් මහා ශීල ව්‍යාපාරය මෙවරත් අතී පූජනීය මහා සංඝරත්නයේ සහභාගීත්වයෙන් පසුගිය පොසොන් පෝදා පනාගොඩ යුද හමුදා බෝධි රාජාරාමයේදී පැවැත් විණි. ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායකගේ පූර්ණ අධීක්‍ෂණ යටතේ නියෝජ්‍ය සේනාවිධායක බ්‍රිගේඩියර් ඩබ්ලිව්එච්ඩී මහානාද ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ ශීල ව්‍යාපාරය සඳහා ගිහි පැවැදි විද්වතුන් රැසකගේ සම්පත් දායකත්වය ලැබුණි. තුන් දහසකට වැඩි උවැසි උවැසියන් පිරිසක් එදින අෂ්ටාංගික ශීල සමාදානයේ යෙදුණු අතර ඔවුන් සියලු දෙනා වෙනුවෙන් උදා, දිවා දානයද ගිලන්පස පිළිගැන්වීම ද විශේෂත්වයකි..













# ඒකක අභිමන් සමරමින්...





පොළොන්නරුව ගිරිතලේ ප්‍රදේශයේ ස්ථානගත 3 (සෙව්) සන්නද්ධ බුද්ධි බලකාය සිය 13 වන ඒකක සංවත්සරය වැ.බ.අණදෙන නිලධාරි මේජර් ඩබ්ලිව්එම්ජේ කරුණාරත්න ආර්එස්පී අයිඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පසුගියදා අභිමානවත් අයුරින් සමරන ලදී. මෙහිදි අණදෙන නිලධාරි වෙත කඳවුරු සම්මාන මුරයක් පිරිනැමු අතර, සියලු නිළ තේ පැන් සංග්‍රහයක්ද සංවත්සර වැඩසටහන අතරට එක්ව තිබුණි.



තිස් වසරක ශාපලත් යුද්ධය නිමා කිරීමට ඉමහත් දායකත්වයක් දැක්වූ 11 (සෙව්) ගජබා රෙජිමේන්තුව මුලතිව් මුලංකාවිල් ප්‍රදේශයේ ස්ථානගත වෙමින් සිය 23 වන සංවත්සරය අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් කේපීඑම් ද ඒ විජේසිංහ ගේ ප්‍රධානත්වයෙන් අභිමානවත් අයුරින් පසුගියදා සමරන ලදී.

යුද හමුදා සම්ප්‍රදායන්ට මුල්තැනක් දෙමින් පැවති මෙම සංවත්සර උත්සවයේදි අණදෙන නිලධාරි වෙත සම්මාන මුරයක් පිරිනැමු අතර, සියලු නිල දිවා භෝජන සංග්‍රහයක් ඇතුළු වැඩසටහන් රාශියක් ද ඊට අතුළත්ව තිබුණි.



යාපනය මරදන්කේනි ප්‍රදේශයේ ස්ථානගත 10 (සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුව සිය 23 වන සංවත්සරය එම ඒකක වැ.බ. අණදෙන නිලධාරි මේජර් එච්එම්අයිකේ සමරනායක ශ්‍රීලංසිරෙ ගේ ප්‍රධානත්වයෙන් පසුගියදා අභිමානවත් අයුරින් සමරන ලදී.



ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළු රෙජිමේන්තුවේ 12 වන සාමාජිකයා ලෙස 1993.05.27 වන දින ත්‍රිකුණාමලය මංකිබ්‍රිජ් කඳවුරේදි ආරම්භ කරන ලද 12 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව පසුගියදා සිය 24 වන බළඇණි දිනය අභිමානවත් අයුරින් අණදෙන නිලධාරි මේජර් පීජ්ඩීපී ගනෙහිආරච්චි ගේ ප්‍රධානත්වයෙන් සමරන ලදි.

# සුබ මොහොතින්
# නව තනතුරු ලැබ



ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බළසේනා
මූලස්ථාන මානි I (පොදු පාලන)
**ලුතිතන් කර්නල් ඩීපීඑන් පෙරේරා**
**ශ්‍රීලයුසේබ**



ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බළසේනා
මූලස්ථාන මානි I (විගණන)
**ලුතිතන් කර්නල් එල්ජේඑම්සීපී**
**ජයසුන්දර විපාරෙ**



2(සෙව්) ශ්‍රී ලංකා යුද හමුදා
පොදුසේවා බලකායේ
වැ.බ. අණදෙන නිලධාරී
**මේජර් ජේඑම්ඒඅයි ගුණසේකර**
**ශ්‍රීලයුපොදුසේබ**



10 (සෙව්) විජයබාහු පාබල
රෙජිමේන්තු
වැ.බ. අණදෙන නිලධාරී
**මේජර් එච්එම්අයිකේ සමරනායක**
**ශ්‍රීලංසිරෙ**



1 ශ්‍රී ලංකා යුද හමුදා පුරෝගාමී
බලකායේ
වැ.බ. අණදෙන නිලධාරී
**මේජර් කේකේසී නිලන්ත ශ්‍රීලයුපුබ**




12(සෙව්) ශ්‍රී ලංකා කාලතුවක්කු
හමුදා රෙජිමේන්තු
වැ.බ. අණදෙන නිලධාරී
**මේජර් එම්එම්එස්පී දිසානායක**
**ශ්‍රීලකාහ**



19 (සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු
වැ.බ. අණදෙන නිළධාරී
**මේජර් එච්එම්යූඩී හේරත් - ශ්‍රීලංසිරෙ**



3 (සෙව්) ශ්‍රී ලංකා යුද හමුදා
කාන්තා බළකා
වැ.බ. අණදෙන නිළධාරිණී
**මේජර් එල්ආර්ටීඑන් ලියනගේ - ශ්‍රීලයුකාබ**



2 (සෙව්) ශ්‍රී ලංකා සංඥා බළකා
අණදෙන නිළධාරී
**ලුතිතන් කර්නල්**
**බීඑම් ජයවීර පීඑස්සී**

# HAPPY BIRTHDAY



පසුගියදා දෙවන වියට පා තැබූ
**කේ. එච්. දම්සර දිල්ශාන් යහම්පත් පුතුට**
සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා, තාත්තා ඇතුළු පවුලේ සැම..
සෙ/12 එච්00974 කෝප්‍රල් යහම්පත් කේඑච්ටී 12(සෙව්) විපාරෙ




පසුගියදා පස්වන වියට පා තැබූ
**එස්. එම්. ඒ. වෙනුදි ශේෂාලි ගුණවර්ධන දියණියට**
සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා, තාත්තා ඇතුළු පවුලේ සැම..
සෙ/19ඊ 00492 ලා/ කෝප්‍රල් ගුණවර්ධන එස්එම්ඒකේජේ 19(සෙව්) ශ්‍රීලංසිරෙ



පසුගියදා පළමු වියට පා තැබූ
**කේ. එච්. කේ. ඕහාෂ සුහස්වින් පුතුට**
සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා, තාත්තා ඇතුළු පවුලේ සැම..
සෙ/ආර්100293 ලා/කෝප්‍රල් කංචනා එච්වීඩී



පසුගියදා පළමු වියට පා තැබූ
**ලුත්මින් සෝභිත ලක්දම් පුතුට**
සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා, තාත්තා ඇතුළු පවුලේ සැම..
සෙ/19කියු 01367 ලා/කෝප්‍රල් සජිත් කුමාර එච්එම්එන්



පසුගියදා උපන්දිනය සැමරූ
**ජේ.එම්. ශලිත අමයුරු ජයසිංහ පුතුට**
සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා, තාත්තා ඇතුළු පවුලේ සැම..
සෙ/ඩී100421 ලා/කෝප්‍රල් ජයසිංහ ජේඑම්එන්කේ



පසුගියදා සිව්වන උපන්දිනය සැමරූ
**වයි.එම්. ජනිදු සත්සර පුතුට**
සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා, තාත්තා ඇතුළු පවුලේ සැම..
සෙ/15ඊ 01798 රසෙ බණ්ඩාර වයිඑම්සීසීඑස්



පසුගියදා අටවන වියට පා තැබූ
**එස්.ඒ. ප්‍රමෝධ්‍යා තත්සරණි** දියණියට
සුභ උපන්දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා, අප්පච්චි ඇතුළු පවුලේ සැම...
සෙ/20එච්00457 සාසෙ නිශාන්ත එස්ඒයූ.



පසුගියදා දොලොස්වන වියට පා තැබූ
**හසින්ත නිමේෂ් ජයරත්න** පුතුට සුභ උපන්දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා, අප්පච්චි ඇතුළු පවුලේ සැම...
සෙ/16එච්00225 සැරයන් ජයරත්න කේඑම්



පසුගියදා තුන්වන වියට පා තැබූ
**කේ.ඩබ්ලිව්. දෙනෙත් නිම්සර** පුතුට සුභ උපන්දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා, අප්පච්චි ඇතුළු පවුලේ සැම...
සෙ/16එච්00679 සාසෙ බංඩාර කේඩබ්ලිව්ටීඑන්



පසුගියදා පස්වන වියට පා තැබූ
**බී.එම්.පී. දුමිඳු නවරත්න** පුතුට සුභ උපන්දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා, අප්පච්චි ඇතුළු පවුලේ සැම...
නි/5480 මේජර් බීඑම්පීසීපී නවරත්න ශ්‍රීලකාහ



පසුගියදා තුන්වන වියට පා තැබූ
**ඩී. පී. කුසලිදු යෙහාර මනුමිත මදුසංක** පුතුට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා, තාත්තා ඇතුළු පවුලේ සැම...
සෙ/101132 සාසෙ මදුසංක ඩීපීඑල්
17 (සෙව්) ගජබා රෙජිමේන්තුව



පසුගියදා හතර වන වියට පා තැබූ ඒ. එම්.
**සයුරි උපෙක්ෂා දියණියට**
සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා, තාත්තා ඇතුළු පවුලේ සැම..
සෙ/17 ඩී 00332

# කවි
# උල්පත





## නුඹ

කිරි ගැහේ සිත
ඔහොම බලන කොට
කඳුලු පුරෝගෙන
මා දිහා

කොහොම බලන්නද
කඩා හැලෙන
මුතු කැට
කඳුලු දිහා මා නෙතින්
හිත තියන්

ලෝබයි ඉරිසියයි
ලස්සනයි පියකරුයි
ඒ උනත් සමනලී
දුක්බරයි හද දවයි
ඔය දෙනෙත්



**කර්නල්**
**එම්පීඒඑන්බී මහතුවක්කාර**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**

## අතීතය

තාර ගැලවී බොල්ව ගිය
පාරවල් අද නෑ
කාපට් ඇතිරූ මං මාවත්
දුවයි දස අත
පතුරු ගැලවී
ගිය බිත්ති
අද වර්ණවත් වී ඇත
තල් අරඹට ඉහලින්
හමායන
මදනල සමග
මුසුව යයි සඳුන් කපුරු සුවඳ
අමතක කරපල්ලා ඒ
දුගඳ හමන අතීතය
වළදාපල්ලා

ඒ අඳුරු මුසල අතීතය

**සෙ/14එෆ්01489**
**සාසෙ කැකුලන්දර කේඑම්එස්කේ**
**14(සෙව්) ගැහේබ**

## මිලින වුවද නුඹ

සුරතල් සිනා පොද
නෙතින් ගැලූ දීප්තිය
දඟකාර කෙළිකවට කම
සැඟව ගියාද පාළු වන ලැහැබක

විකසිතවන්නට පෙරාතුවම
මිලින වූවාද නුඹ
නරුම පාපතරයෙකුගේ ගොදුරක් වන්නට
නුඹ කළ අකුසලය කිම

විශ්වයම සලිත කළ අපරාධයක තරම
රැකගන්න නොහැකි වුයේ මන්ද?
ජාති ජාතිත් නොවන්නට
මෙවන් විපතක්
පතන්නම් නිවන් මග සැනසෙන්න
මතු බවහි...


**සෙ/5ඊ01784**
**සැරයන් වීරසිංහ ඩබ්ලිව්ඩීඑන්සී**
**5(සෙව්) ශ්‍රීලංසිරෙ.**

## වෙසක් සඳයි තල් අරණයි

| | |
|---|---|
| තෙමඟුල දිනේ සිහිකර යාපා | පටුන |
| දසතින් බබලවයි වෙසගේ බුදු | සසුන |
| යාපනෙ වැසියනගෙ නෙත් විස්මිත | කරන |
| බුදුරැස් විහිදවයි නගරයෙ ඇති | තොරණ |
| කඳුරුගොඩ විහාරය දඹකොළ | පටුන |
| යාපනෙ කොටුව ළඟ ඇති නා | විහාරය |
| සාදු නද මිසක් දූන් නැත | විලාපය |
| හේවිසි හඬින් රැව්දෙති නාග | දීපය |
| විරුකැළ විසින් සාදා නිමකළ | තොරණේ |
| වෛරය එපා යන්නෙන් අදහස් | කෙරුණේ |
| දශක තුනක් යුධ කෙරුවත් මේ | දෙරණේ |
| ආගම් බේද දූන් නැත මේ තල් | අරණේ |
| තෙමඟුල දිනේ අත රැඳි අවි බිම | තබලා |
| නැත නිළ ඇඳුම එදිනට සුදුවත | ඇඳලා |
| සිහල දමිළ එකමුතුවී වැඩ | කරලා |
| තෙමඟුල සැමරුවා සම්බුදුන් සිහි | කරලා |

**සෙ/15කිව් 01482**
**ලා/කෝ ගුණතිලක එච්එම්පීඅයිඑස්**
**15 ශ්‍රීලංජාආබමු**

## තුති පිදුම



ඇද හැලුණු වැසිදිය කඳ
නදී දිය හා පහුරු බැඳ
කළ හදිය අප විදු බිමට ද එළෙසම විය...
දරු පැටවුන්ගේ
පන්ති කාමර පොත පත හා තවත් දේ
දියබත් කර
සොබාදම් දිනිතිය
දක්වූ කුරිරු ප්‍රතිචාරයෙන්
සැමතින්ම වැටුණු අපහට
නැගී සිටින්නට
මිනිසත්කමේ නාමයෙන්
අතහිත දුන් ඔබ සැමට
සහෘදත්වයේ
ගැඹුරුම තැනින් විකසිත වූ
සෙනෙහසේ තුති කුසුම් පොකුරු
පුදදෙමු හරසර පෙරදැරිව
මෙලෙසින්



(පසුගියදා දිවයිනටම බලපෑ අයහපත් කාළගුණය හේතුවෙන් ඇතිවූ ගංවතුර තත්ත්වය නිසා මාතර වෙහෙරගම්පිටිය ඕල්කට් විදුහලේ දූදරුවන්ගේ අධ්‍යාපන කටයුතු ද කඩාවැටුණි. ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු යළිත් ආරම්භ කිරීමට පාසල යථාතත්ත්වයට පත්කිරීමට දායක වූ 3(සෙව්) ගැමුණු හේවා බළඇණියට ප්‍රණාමය පුදකරමින් එම විදුහල්පති එවූ පැදි පෙළකි.)

## සතුට සහ සාර්ථකත්වය සඳහා

# ජීවිත කළමනාකරණ උපාය මාර්ග

පසුගිය කලාපය හා බැඳේ...



## අදහන්න!
### එය ඔබටත් කළහැකි බව
## විශ්වාස කරන්න

දෛවය ඔබට සුවිශේෂී දෙයක් පිරිනමනුයේ අති දුෂ්කර යෝග්‍යතා පරීක්ෂණයකට බඳුන් කිරීමෙන් අනතුරුවය. ඊට සුභවාදීව මුහුණ දෙන්න. ඔබට ජයග්‍රහණය පිරිනැමෙනුයේ ඉන් අනතුරුවය. එබැවින් ඊට සූදානමින් කටයුතු කරන්න. සුභවාදී වන්න. අප මුහුණපා සිටින ප්‍රශ්නවලට අප දන්නා විසඳුම් සංඛ්‍යාවට වඩා වැඩි සහ යහපත් විසඳුම් සංඛ්‍යාවක් තිබිය හැකිය.

**"කනස්සල්ල පලවා හරින්න. ඉන් ඔබට කිසිදු යහපතක් සිදුනොවේ. එමගින් සිදුවනුයේ, අතාර්කික වීම මගින් ඔබේ සිතෙහි සතුට නැති කර පසුතැවිල්ලෙන් පසුවීමට ඔබව පෙළැඹවීම සහ කිසිදු ඵලදායී කටයුත්තක යෙදී සිටීම වැලැක්වීමත් පමණකි."**

ජීවිතය වනාහි එකිනෙකා පරයා ගොස් ප්‍රථමයාම විය යුතු තරඟයක් නොවේ. ඔබට කළහැකි උපරිමය කර ඉතිරිය සිදුවීමට ඉඩහරින්න. ඇතැම්විට ඔබේ ප්‍රයත්නය සාර්ථක විය හැකි ය. ඇතැම් විටෙක එම ප්‍රයත්නයන් අසාර්ථක වීමට ද ඉඩකඩ ඇත. එවැනි අවස්ථාවලදී උපේක්ෂා සහගත වීමත් බලාපොරොත්තු සහගත වීමත් අවශ්‍යය. එසේම හේතුවාදීවීමෙන් සහ ඔබේම සැලසුම ක්‍රියාත්මක වියයුතුය යන මතයෙන්ද බැහැර විය යුතුය. මක්නිසාදයත් ඔබේ ජීවිතයට සිදුවිය යුතු සුදුසුම දෙය ඔබේ දෛවය නිශ්චිතවම දන්නා හෙයිනි. එය ඔබට ලැබිය යුතු නිවැරදිම අවස්ථාවේදී ලබාදීමට දෛවය කටයුතු සලස්වනු ඇත.

ඔබ ඔබගේ අනාගත ජීවිත බලාපොරොත්තු පිළිබඳව සුභ සිහින දකින්න. ඔබ කිරීමට කැමැත්තෙන් සිටි දේවල් පිළිබඳව උත්සාහ කරන්න. අනියත බිය සහ අවිශ්වාසය දියුණුවට දැඩි බාධා ඇති කරයි. ජයග්‍රහණ බොහෝ විට ලැබෙනුයේ අවදානම් සහගත උත්සාහයන්වලින් පසුවය. එබැවින් එවැනි උත්සාහයන්හි ධනාත්මක ලෙස යෙදෙන්න. ජීවිතයේ ඕනෑම අයහපත් සිදුවීමක යහපත් පැත්තක්ද තිබෙනවා. අවාසනාවකට මෙන් බොහෝ අය දැකීමට පුරුදු වී සිටින්නේ අයහපත් පැත්ත පමණකි. මෙය ඉතා පැහැදිලි ලෙස විස්තර වන පැරණි සෙන් කතාවක් තිබෙනවා.

## ගොවියා සහ අශ්වයාගේ කතාව.

ඔන්න එකෝමත් එක කාලයක එක්තරා ගමක දුප්පත් ගොවියෙක් හිටියා. ඉතින් මේ ගොවියාට බර වැඩ කරල දෙන අශ්වයෙක් හිටියා. එයාට වටිනා සම්පතකට කියල තිබුණෙ මේ  අශ්වයා විතරමයි. දවසක් මේ අශ්වයා වැඩ කරමින් ඉන්නකොට එක පාරටම කුලප්පු වෙලා කැලයට පැනල ගියා. ඉතින් ගොවියාගෙ අසල්වැසියො ඇවිල්ල කියන්න පටන් ගත්ත "බලන්න අවාසනාවක තරම. ඔයාට සම්පතකට කියල තිබුණෙ ඔය අශ්වයා විතරමයි. දැන් ඒකත් නැති වුනා. ඔයා නම් හරිම අවාසනාවන්තයෙක්" කියල. ඒත් ගොවිය හිනාවෙලා කිව්ව "වාසනාවද අවාසනාවද කව්ද දන්නෙ, ඒක කියන්න දැන්ම ම බැහැනෙ" කියල. එහෙම කියල ගොවිය සතුටින්ම තමන්ගෙ පුතත් එක්ක එකතුවෙලා අතින්ම කුඹුර කෙටුවා.

ටික දවසකට පස්සෙ මෙන්න අර පැනල ගිය අශ්වය තව වල් අශ්වයො කිහිප දෙනෙකුත් එක්ක ආපසු ගොවිපලට ආවා. ආයෙත් ගොවියාගෙ අසල්වැසියො ඇවිල්ල කියන්න පටන් ගත්ත "බලන්න ඔයා නම් හරිම වාසනාවන්තයෙක්, ඔයාට හිටියෙ එක අශ්වයයි. දැන් ඒ ඔක්කොටම හරියන්න ඔය ඉන්නෙ අශ්වයො රංචුවක්ම" කියල. ඒත් ගොවිය හිනාවෙලා කිව්ව "වාසනාවද අවාසනාවද කව්ද දන්නෙ, ඒක කියන්න දැන්ම ම බැහැනෙ" කියල. එහෙම කියල ගොවියා සතුටින්ම තමන්ගෙ පුතත් එක්ක එකතුවෙලා අර කැලෑවෙන් ආපු අශ්වයින්ව වැඩට පුරුදු කරගන්න හීලෑ කිරීමෙහි යෙදුණා.

මෙහෙම අශ්වයො හීලෑ කිරීමෙහි යෙදිල ඉන්න අතරෙ දවසක් ගොවියගෙ පුතා අශ්වයෙකුගෙ පිට උඩින් බිමට වැටිල කකුලක් කැඩුණා. ආයෙත් ගොවියාගෙ අසල්වැසියො ඇවිල්ල කියන්න පටන් ගත්ත "බලන්න අවාසනාවක තරම. ඔයාට නම් එක දිගටම කරදරමයි වෙන්නෙ. දැන් ඉතින් ඔයාට උදව් වෙන්න හිටිය එකම පුතාටත් තුවාල වුණානෙ " කියල. ඒත් ගොවියනම් සුපුරුදු විදියටම හිනාවෙලා කිව්වෙ "වාසනාවද අවාසනාවද කව්ද දන්නෙ, ඒක කියන්න දැන්මම බැහැනෙ" කියලයි.

ටික දවසක් ගෙවුණා. පුතා කකුල කැඩිල ලෙඩ ඇඳේ, ගොවිය තනියෙන්ම ගොවිපලේ වැඩ වල යෙදුණා. ඔහු ජීවිතේ හැම දෙයක්ම සුබවාදීව බාර ගන්න කෙනෙක්නෙ. ඒ නිසා තමන්ට කරන්න වෙලා තිබුණු හැම වැඩකම සතුටින්ම යෙදුණා. මේ අතරෙ ගොවියගෙ රට අල්ලපු රටත් සමග යුද්දෙකට පැටළුණා. එක දවසක් යුද හමුදවෙ නිලධාරින් මේ ගමට ආවා. ඒ ආවෙ රාජ ආඥවක් අරගෙන. හමුදවට ගන්න වයසෙ සියලුම තරුණයින් අනිවාර්ය හමුද සේවයට බඳවා ගන්න. කකුල කැඩිල හිටපු ගොවියගෙ පුතා ඉතිරි වෙන්න ගමේ අනක් තරුණයො ඔක්කොම යුද්දෙට අරන් ගියා.

මේ කෙටි කතාවෙන් ඉගැන්වෙන පාඩම වෙන්නේ ජීවිතයේ සියලු සිදුවීම් හමුවෙහි සුබවාදී විය යුතුයි කියන එකයි. එහෙමත් නැත්නම් උපේක්‍ෂා සහගත විය යුතුබව කියන එකයි. ජීවිතයේ එක් අවස්ථාවක් අහිමි වන විට වෙනත් අනපේක්ෂිත අවස්ථාවක් උදා වෙනවා. ඔබ උත්සාහ කර අහිමි වූ අවස්ථා බොහෝ ගණනක් ජීවිතයේ තිබිය හැකියි. එසේ වන්නට ඇත්තේ ඔබව, ඔබ







උත්සාහ කළ දෙයට වඩා වෙනස් දෙයක් වෙත යොමු කරවීමටයි. එබැවින් ඒ පිළිබඳව ධනාත්මක වන්න.

මිනිසුන් බොහෝ විට ජීවිතයට මුහුණ දෙන්නේ වැසි කුණාටුවකට මුහුන දෙන ආකාරයට ය. එනම් කිසියම් මොහොතක කුණාටුව නතර වෙන තෙක් කිසිවක් නොකර අපි බලා සිටින්නෙමු. එහෙත් කුණාටුව පවතිද්දීම සාර්ථකව නිම කලහැකි බොහෝ අවස්ථාවන් අපවෙත උදවේ. අවාසනාවකට මෙන් එවැනි අවස්ථාවන් ග්‍රහණය කර ගැනීමට උත්සාහයක නොයෙදී තත්ත්වය ඉබේ සමහන් වනතෙක් අපි බලා සිටිමු. එබැවින් කුණාටුව පවතින අතර තුර කළහැකි දෙයක යෙදෙන්න. සුබවාදී වන්න, බලාපොරොත්තු දල්වා ගන්න. සැලසුම් කරන්න සැලසුමට අනුව පළමු පියවර තබන්න. කල හැකි මූලික කටයුතුවල යෙදෙන්න. කුණාටුව අවසන් වීමත් සමග වේගය වැඩි කරන්න.

ඇතැම්විට අප මුහුනපා සිටින ගැටළුවකට අප කිසිදු ලෙසකින් බලාපොරොත්තු නොවූ ආකාරයක විසඳුමක් ලැබීමට පිළිවන. එහෙත් එම ප්‍රශ්නයට ලැබිය යුතුව තිබූ හොඳම විසඳුම ලැබී ඇති බව කලකට පසුව අපටම දැනගන්නට ලැබෙනු ඇත. විශ්වාස කරන්න විශ්වයට අප විෂයෙහි වඩා යහපත් සැලැස්මක් ඇත. ඕනෑම අයහපත් සිදුවීමකදී ජීවිතය පිළිබඳව කිසිදු බලාපොරොත්තුවක් අත් හැර නොදමන්න. එම සිදුවීමෙන් උගත හැකි ජීවිත පාඩම ලබාගන්න. අසුබ වාදී නොවන්න. ඕනෑම අයහපත් සිදුවීමක් කිසියම් කාල සීමාවක් තුල අවසන්වේ.

බොහෝවිට ජීවිතයේ අගනා අවස්ථාවන් උදවන්නේ අවාසනාවන්ත සහ කණගාටුදායක සිදුවීම් හරහාය. එබැවින් එවැනි අවාසනාවන්ත සහ කණගාටුදායක සිදුවීම් තුළ සැඟව එන අනගි අවස්ථාව ග්‍රහණය කර ගැනීමට සූදනමින් සිටින්න.

**ලුතිතන් කර්නල් චන්න කරුණාරත්න - රශූප (විශ්‍රාමික)**
**ජීවිත මාර්ගෝපදේශන උපදේශක**

මීළඟ කලාපය හා සම්බන්ධයි.

# ගේය පදරුත්
# විමසුම





ගේය පද
**ප්‍රේමකිර්ති ද අල්විස්**



හඬ හා සත්සර
**මර්වින් පෙරේරා**

**පදරුත් විමසුම :- ලා/කෝ සුජීව කුමාර කෝවිලතැන්න**

මේ නගරය මා ඔබ
මුණ ගැසුණු නගරයයි
මේ නගරය මා ඔබ
වෙන් කෙරුණු නගරයයි

වැව් ඉවුරේ දිය රළ පෙරසේම බිඳෙනවා
නුග ගස් පෙළ අප නැතුවත් තව දළුලනවා
සරසවි බිම කඳු රැල්ලෙන් එතෙර පෙනෙනවා
ඔබත් එක්ක ආයෙත් එහි යන්න හිතෙනවා

ඔබ අතගෙන ගිය වීදියෙ ඈ හා යනවා
සිඟිති පුතා අතගිල්ලක එල්ලී එනවා
ඒ කාලේ පැතූ පැතුම් යළි සිහිවෙනවා
ජීවිතයම හීනයකැයි කියා සිතෙනවා

ගේයපදකරුවා වූ කලී අපූරු දෑ මවන්නෙකි. ගල් වඩුවෙකු තමනට හමුවන රළුපරලු කලු ගලක් මට සිලිටු කොට ඔපදමා භාවයන් කුළුගන්වන ශෛලමය ප්‍රතිමාවක් නෙලන්නාසේ ගේයපදකරුවා ද බස මූලික කොට ගනිමින්, සමාජමය වශයෙන් හෝ පුද්ගලික වශයෙන් විඳීමට ලැබෙන අත්දැකීමක් (අනුභූතියක්) තම පරිකල්පන ශක්තියට ප්‍රතිභාව මුසුකොට අපූරත්වයෙන් යුතු ගීපද නිර්මාණය කරයි. ගේයපදකරුවාට තම නිර්මාණ සඳහා බොහෝ විට ගෝචර වන්නේ ඔහු ජීවත්වන සමාජ පරිසරයෙන් උකහාගත් යම් පුද්ගලික හෝ සමාජ අත්දැකීම් විය හැකිය. සමහර අත්දැකීම් බොහෝ විට දුරාවාරයේ අත්විඳින, අත්දකින සිදුවීම් විය හැකිය. සමහර අත්දැකීම් අප සමාජයේ නිරන්තරයෙන් අසන්නට

# මේ නගරය

දකින්නට ලැබෙන සුලභ සිදුවීමක් විය හැකිය. ප්‍රතිභා ශක්තිය, වාසනා ගුණෝප්පත්තිය, පරිකල්පන ශක්තිය හිමි නිර්මාණකරුවාට මෙම කුමන අත්දැකීමක් වුවද තම නිර්මාණකරණය සඳහා පාදක කර ගැනීම ගැටලුවක් වන්නේ නැත. ගල් වඩුවෙකුට ලැබෙන කලු ගලක් මට සිලුටු කොට ඔපදමා භාවයන් උත්පාදනය වන අයුරින් ප්‍රතිමා නෙලන්නා සේ, බසේ සොඳුරු අර්ථයන් ස්පර්ෂ කරමින් ගේයපදකරු ද. අපූරු ගීතයක් පබඳියි. මෙවර ගේයපදයක මිහිර තුළින් ගෙන එනු ලබන්නේ අපූරු (පෙර නොවූ විරූ) අත්දැකීමක් නොවුනත් අපූර්වත්වය ජීවමාන කරවමින් ලියූ ගීතයකි. සමහර විට ඔබ ද, මම ද මේ අත්දැකීම විඳ නොමැති වීමට පුලුවන. එහෙත් ගීතය රස විඳීමේදී මෙය තමන්ගේම පුද්ගලික අත්දැකීමක් නොවේදැයි සිතෙන තරමට මෙම ගීතය භාවාත්මකය.

නගරය වූ කලී අපූරු තැනකි. දහසක් දනෝ නගරය කරා ඇදී එති. ඒ දහසකුත් අවශ්‍යතා පිරිමසා ගනු පිණිසයි. සමහරෙක් නගරය කරා ඇදී එන්නේ වෙළහෙළඳාම සඳහා විය හැකිය. තවකෙක් අසනීපයකට බෙහෙත් බෝතලයක් ගනු පිණිස විය හැකිය. තවකෙක් රජයේ කාර්යාලයකින් ඉටුකරගත යුතු රාජකාරි වැඩක් ඉටුකර ගනු පිණිස නගරය කරා ඒමටද පුලුවන. සමහරු රැකියාව සඳහා ද එති. මෙසේ එන සමහරුන් නගරයම ජීවිත කාලය පුරාවටම නැවතුම් පොළක් කර ගනී. කෙසේ හෝ මෙසේ ආ කළ අලුත් හිතමිතුරුන් ඇතිවේ. ඒ අහඹු මිතුරුදම බොහෝ දුර ගොස් ලේ ඥාතිකම් වලටත් වඩා වැඩි ආධ්‍යාත්මික බැඳීම් බවට පත් වේ. එසේම නගරයේ දි එලෙස මුණ ගැසෙන සමහරු නගරය අතහැර යනවිට තම මතකයන් නගරයේම තබා යති. කෙටියෙන්ම පැවසුවහොත් නගරය මිනිසුන් මුණගස්සවන තැනකි. එළෙසම වෙන්කරවන තැනකි. මේ ද එවන් හමුවීමකි. එවන් වෙන්වීමකි.

**මේ නගරය මා ඔබ**<br>**මුණ ගැසුණු නගරයයි**<br>**මේ නගරය මා ඔබ**<br>**වෙන් කෙරුණු නගරයයි**

ඔහු කළකට පෙර පෙම්වතෙකි. ඔවුනොවුන්ගේ හමුවීම නගරයේ දි සිදුව තිබේ. එහෙත් නගරයේදීම ප්‍රේමයට තිත තැබුවෙකි. ගීතයේ පළමු පදපෙළ රසික දන අපූරු ඉසව්වක් කරා රැගෙන ගොස් අමුතුම කතන්දරයක් කීමට සැරසේ. සැබවින්ම මෙහි ව්‍යාංගාර්ථ. උපමා රූපක නොමැත. කාව්‍යයෝක්ති හෝ වක්‍රෝක්ති නැත. ගේයතා ගුණ නොමැත. ඇත්තේ වාර්තාමය ස්වරූපයකි. නමුදු වාර්තාමය ස්වරූපය තුළ පවා ඇත්තේ අපූර්වත්වයකි. සැබැවින්ම මෙම වර්තාමය ස්වරූපය තුළින් දිවයන යටි අරුත් පෙළක් ඇතැයි හැඟේ. එය කුමක්ද?. එය විග්‍රහ කිරීම පසුවට තබා මෙහි මතුපිට අරුත විමසා බළමු.

අප කතානායකයා නගරයට පැමිණ තිබේ. ඒ බොහෝ කළකට පසුය. එහිදි ඔහුගේ පැරණි පෙම්වතිය දකින්නට ලැබේ. එම දැකීම තුළින් ඔහුගේ අතීතය ස්මරණය වේ. මන්ද ඔහු පෙම්කළ යුවතිය හා, හා පුරා කියා මුණගැස්සුවේ මේ නගරය නිසාවෙනි. එහෙත් අවාසනාවක මහත. ඔවුනොවුන් හාපුරා කියා මුණගැසුණු නගරයේ දීම ඔවුන්ට වෙන්වීමට සිදුවී ඇත. එහෙත් මතකයන් තවමත් නැවුම්ය.

**වැව් ඉවුරේ දිය රළ පෙරසේම බිඳෙනවා**<br>**නුග ගස් පෙළ අප නැතුවත් තව දළුලනවා**<br>**සරසවි බිම කඳු රැල්ලෙන් එතෙර පෙනෙනවා**<br>**ඔබත් එක්ක ආයෙත් එහි යන්න හිතෙනවා**

ඔවුන් පෙම් වදන් දොඩමින් ඇවිද ගිය වැ කන්දේ හැපුනු දියරළ පෙළ තවමත් වැ කන්ද සිප ගනිමින් විසිර යයි. එසේත් නැතිනම් වැ කන්දේ වැදි පෙර ලෙසම සිඳිබිඳී යයි. ඒ පමණක් නොව ඔවුනගේ මතකයන් අතරේ සැඟව නොගිය ඒ මහා වෘක්ෂයේ සිසිලස තවමත් ඔහුට දැනෙන සේය. ඔවුනොවුන් එකට තුරුලුවී සිටි නුග ගස් පෙළ තවමත් පෙර ලෙසම දළුලමින් ඇත. එහෙත් ඔවුන් **"සරසවි බිම කඳු රැල්ලෙන් එතෙර පෙනෙනවා"** මෙම පෙම්වතාට පෙම්වතිය මුණගැසී ඇත්තේ සරසවි අධ්‍යාපනය සඳහා නගරයට පැමිණි පසු බව මෙමගින් විද්‍යාමාන වේ. මෙය පේරාදෙණිය සරසවිය විය යුතුය. මන්ද පේරාදේනිය සරසවි බිම පුරාවට අපමන සිසිලස ගෙනන නුග වෘකෂයන් දකිය හැකිය. **"ඔබත් එක්ක ආයෙත් එහි යන්න හිතෙනවා"** ඔවුන්ගේ අතීතය සොඳුරු බව මෙමඟින් සනාථ කරයි. ඒ නිසාම ඔහු ඒ අතීතයට පියමංකිරීමට ආශා කරන බව පවසයි.

**ඔබ අතගෙන ගිය වීදියෙ ඈ හා යනවා**<br>**සිඟිති පුතා අතඟිල්ලක එල්ලී එනවා**<br>**ඒ කාලේ පැතූ පැතුම් යළි සිහිවෙනවා**<br>**ජීවිතයම හීනයකැයි කියා සිතෙනවා**

මෙය සරසවි පෙම්වතුන් පමණක් නොව බොහෝ පෙම්වතුන් අත්විඳිනා අත්දැකීමකි. නගරයේ මුණ ගැසෙන බොහෝ පෙම්වතුන් නගරයෙන් ඉවත්ව ගිය පසු එම ප්‍රේමයට තිත තබති. නමුදු ලාංකීය සරසවි ප්‍රේමය මල්ඵල නොගැනීමට හේතුභූත වූ කාරණා රාශියක් දක්නට ඇත. ඒ සඳහා පවතින සමාජ ආර්ථික, දේශපාලන තත්ත්වයන් ඍජුව හෝ වක්‍රව බලපාන බවද කිව යුතුය. විශේෂයෙන් ලාංකීය සරසවි සිසුන් මුහුණ දෙන පොදු ඛේදාන්තයක් වන්නේ සරසවියෙන් පිටවූ පසු විරැකියා පෝළිමට එක්වීමට සිදුවීමයි. එය වසර හත අටක් විය හැකිය. මෙය පිරිමි පාර්ශ්වය පැත්තෙන් කෙසේ වුවත් ගැහැණු පාර්ශ්වය පැත්තෙන් බැලූ කළ මහා ඛේදාන්තයකි. මන්ද අවුරුදු 20 කදී සරසවියට පිය නගන යුවතියක් උපාධිය අහවර වන විට තවත් අවුරුදු හත අටක් ගෙවී ගොස්ය. (මන්ද ලංකාවේ සරසවි වැඩිපුර ඇත්තේ අරගල නිසාවෙන් වසා තබලාය) එසේ එන ඇයගේ රූප දේහය වියකී යෑමට ආසන්නය. දරුවෙකු තැනීමට තරම් අවැසි කාය ශක්තිය හීන වෙමින් යන්නේය. මේ නිසාම දෙමව්පියෝ ඇයට ඉක්මනින් විවාහයක් කරදීමට කටයුතු කරති. රැකියාවක් සොයාගෙන තමා වෙත එන

සරසවි පෙම්වතා එනතුරු බලාසිටීමට ඇයට හැකියාවක් නැත. මන්ද සමාජය විසින් ඇයට පැවැරූ සංස්කෘතික වගකීම් රාශියක් ඉටුකිරීමට ඇය බැඳී සිටින නිසාවෙනි. ඒ නිසාම ඇය සරසවි පෙම්වතා අතහැර වෙනත් විවාහ කර ගනිති. සරසවි පෙම්වතා වසර කිහිපයක් රැකියා පෝළිමේ සිට එන විට ස්තාලයේ දොර විවරය. අශ්වය පැන ගොසිනි.

මෙම පෙම්වතාට ද එහෙම ඉරණමක් අත්වුවාදැයි නොදනීමි. ඒ නිසාම ඔහු පසු කලෙක වෙනත් විවාහයක් කර ගන්නට ඇත. බොහෝ විට මෙම විප්‍රයෝගය දැනවීම සඳහා ලියවුන ගීත රාශියක් අපේ හෙළ ගී කෙතේ දක්නට පිළිවෙන. එහිදී තම පැරණි පෙම්වතිය ඇයගේ දරුවෙකු හා සම්බන්ධකොට තම භාවයන් ප්‍රකාශ කිරීම සිදුකළත් මෙම ගීතය තුළ ඇත්තේ පෙම්වතා තම පුතු සහ බිරිඳ හා සම්බන්ධ කොටගෙන තම හැඟීම් ප්‍රකාශ කිරීම වේ. **"පෙර දිනයක මා පෙම්කළ යුවතිය සිය පුතු නලවනවා"** (පණ්ඩිත අමරදේව) වැනි ගීත එවැනි ගී සඳහා නිදසුන් ලෙස පෙන්වා දිය හැකිය. "ඔබ අතගෙන ගිය වීදියෙ ඇ හා යනවා" - "සිඟිති පුතා අතඟිල්ලක එල්ලී එනවා" වැනි යෙදුම් මගින් අප කතානායකයා ඔහු වටා කේන්ද්‍ර වූ පවුල් සංස්ථාව ගැන කියයි. එමඟින් අපූරු චිත්ත රූපාවලියක් නෙතටද, හැඟීම් රාශියක් හදවතට ද මවාගත හැකිය. "ඒ කාලේ පැතූ පැතුම් යළි සිහිවෙනවා" මොවුන් ගේ අතීතය වූ කලී ඉතාම රමණීය එකක් බව පෙනේ. සැබවින්ම පෙම්කරන සමය සොඳුරුබර එකකි. එහෙත් විවාහයෙන් පසු එළඹෙන යුගය? ඔවුන් දෙදෙනා ද මෙලෙස සිඟිති පුතෙකුගේ අත අල්ලාගෙන තමන් රිසිසේ පෙම්කළ නගරයේ ඇවිද යන්නට පැතුම් පැතුවා විය හැකිය. එහෙත් එය සිහිනයක්වී ඇත. ඒ නිසාම ඔහුට දැනෙන අයුරින්, සිතෙන අයුරින් ජීවිතය යනු සිහිනයකි. මන්ද ඔවුන් පෙම්කළ සමයේ මැවූ බොහෝ සිහින මේ වන විටත් සිහින බවට පත්ව ඇති නිසාවෙනි.

මෙලෙස මා ඉහතින් විවරණය කරණු ලැබූවේ ගීතයේ මතුපිට අරුත් ගැන්වීම වේ. එහෙත් මෙහි යටිපෙළ අරුත් ගැන්වීම ද අපූරුය. එය මදක් විමසා බලමු.

**මේ නගරය මා ඔබ**
**මුණ ගැසුණු නගරයයි**
**මේ නගරය මා ඔබ**
**වෙන් කෙරුණු නගරයයි**

සොබා දහම, බුදු දහම සුසංයෝගයෙන් අපූරු ජීවිත විවරණයක්, ජීවිතය පිළිබඳ කියවීමක් මෙම ගීතයේ යටි අරුත්පෙළේ සඟවා ඇතැයි උපකල්පනය කළ හැකිය. සංසාරික ගමන් මගේ දි මිනිස්සු හමුවෙති. වෙන්වෙති. ඒ එක් නවාතැන් පොළක අප වත්මනේ උත්පත්තිය ලබා ඇත්තේය. "මේ නගරය වූ කලි වෙන කිසිවක් නොව වර්තමානයේ අප ජීවත්වන ලෝකයයි. සංසාරික ගමනේ එක් නවාතැන් පොළක් වූ මේ ආත්මයයි. අප ඉපදෙන මැරෙන ලෝකයයි.

**වැව් ඉවුරේ දිය රළ පෙර සේම බිඳෙනවා**
**නුග ගස් පෙළ අප නැතුවත් තව දළුලනවා//**
**සරසවි බිම කඳු රැල්ලෙන් එතෙර පෙනෙනවා**
**ඔබත් එක්ක ආයෙත් එහි යන්න හිතෙනවා**

ලෝකයේ ගමන් මඟ වූ කලි කිසිවෙකුට වෙනස් කළ නොහැකිය. එය සොබා දහමේ නීතියට අනුව ක්‍රියාත්මක වේ. උදයේ හිරු නැග එයි. සවසට බැස යයි. විටක සීත ඍතුවකි. තවත් විටක ගිම්හාන ඍතුවකි. තවත් විටෙක වස්සාන ඍතුවකි. මුහුදු දිය රැළි නංවයි. ගොඩ ගලයි. භූමි කම්පා ඇති කරයි, ගිනි කඳු පුපුරා යයි. ගංවතුර, නියඟ ඇති කරයි. මේ කිසිවක් අපට වෙනස් කළ නොහැක. නමුදු සියල්ල සිදුවන්නේ සොබා දහමට අවනත නොවන මිනිසුන්ගේ ක්‍රියාකාකරම් වලට ප්‍රතිචාර වශයෙනි. **"වැව් ඉවුරේ දිය රළ පෙරසේම බිඳෙනවා- නුග ගස් පෙළ අප නැතුවත් තව දළුලනවා"** මෙමඟින් සොබා දහමේ නියත අපට අපූරුවට පසක් නොකරවයිද?

**ඔබ අතගෙන ගිය වීදියෙ ඈ හා යනවා**
**සිඟිති පුතා අතඟිල්ලක එල්ලී එනවා...//**
**ඒ කාලේ පැතූ පැතුම් යළි සිහිවෙනවා**
**ජීවිතයම හීනයකැයි කියා සිතෙනවා**

තෙරක් නොපෙනන සංසාර සයුරේ අතරංමව ඒ මේ අත පිනා යන අපට බොහෝ පිරිසක් හමුවෙති. වෙන්වෙති. ඔවුන් හා එක්ව අප බොහෝ දේ ප්‍රාර්ථනා කරති. නමුදු අප සියල්ලටම මේ සංසාරගත නවාතැන් පොලෙන් පිටව යෑමට සිදුවේ. මේ ජීවිතයේ යථාර්ථයයි. ජීවිත පිළිබඳ සත්‍යයි. නොමැරෙන මිනිසුන් ලෙස නිලය, ධනය, බලය රැස් කළත් මේ සියල්ල හැරදමා යා යුතුය. **"ජීවිතයම හීනයකැයි කියා සිතෙනවා"** මෙම වදන් පෙළ ගීතයේ කූඨප්‍රප්තිය වේ. ජීවිතය පිළිබඳ නිස්කාර කියවීමක් නොව ඇරත්බර කියවීමක් මේ ගිතයේ යටි ඇරත් පෙල තුළ සඟවා නැතැයි කාටනම් කිව හැකිද?

මෙම ගීතය නැසීගිය ප්‍රේමකිර්තිද අල්විස් කලාකරුවා හෙළ ගී කෙත අස්වැදීමට හෙළු දහඩිය බිඳුවලින් ශේෂ මාත්‍රයක් පමණකි. ඉතා සරල සුගම බස් වහරක් උපයෝගි කරගනිමින් සමාජයේ සුලභ සිදුවීමක් පාදක කර ගනිමින් ජීවිතය පිළිබඳ මහා කියවීමක් මෙමඟින් ඔහු අපූරුවට ඉදිරිපත් කර ඇති අයුරු විශිෂ්ටය. එළෙසම ප්‍රතිභාපූර්ණ ගායන ශිල්පි මර්වින් පෙරේරාගේ භාවාතිෂමය ගැඹුරු හඬ රසික දන මන විඥානය පුබුදු කරවයි. ඔහුගේ සංගීත සුසංයෝජනය රසික දන අපූරු මනෝමය ලෝකයක් තුළට කැඳවාගෙන ගොස් දැහැන් ගත කරවයි. සැබැවින්ම **"මේ නගරය මා ඔබ"** ගීතය වූ කලී විටෙක ආදරයේ සොඳුරුබව, සම්මුඛවීම, වෙන්වීම, පිළිබඳ වඩාත් හැඟුම්බර භාවමය ප්‍රකාශනයකි. තවත් විටෙක ජීවිතයේ ගැඹුර කියන මහා දාර්ශනික කියවීමකි.

# කවි උල්පත



## මව් පදවිය

අන්දා සුදු වතක් රත්පැහැ හැඳි ගතට
බැන්දා එකතුකර ඉහිරුණු කෙස් තදට
කැන්දා ඔබව ගෙන යන විට සැත්කමට
මන්දා හිත ගැහෙයි මට ඇහෙනව පිටට

ඉන්දා නුඹේ කොන්දට කටුඅණින විට
වැන්දා හිතින් දෙවියන් යැදිමින් පිහිට
බන්දා තිර පටක් පුතු හා නුඹ මැදට
සින්දා නුඹේ වත මට ඇඬුනා දුකට

යටි බඩ දිගේ පිහිතුඩ දිවගොස් තීරූ
සිටි සිටි ගගා ලේ බිඳු සයනට බේරූ
ඉටිමල වගේ කුස ඉරී ඉරී යන සීරූ
හිටි දෙපයට පවා මටනම් නැත වාරූ

මල්වට්ටිය වගේ එනතුරු කිරිකැටියා
ගල් පිළිමය වගේ නුඹ නොසැලී සිටියා
මුල්වර උරන විට කිරි නුඹේ දරු පැටියා
උල් කටු ගොඩක් නුඹෙ බඩ මහමින් සිටියා

බිම්බා බිසව් දුන් මව් පදවියත් රැක
කම්බායකින් ලේ පැල්ලම් වසනු දැක
පිම්බා සුසුම් නුඹ ලඟ මට මියනු හැක
සිම්බා අනේ නුඹ කිරි සුවඳයි මැණික

**සෙ/එච්101057**
**සාසෙ දිසානායක ඩීඑම්අයිඑස්**
**16 (සෙව්) විපාරෙ**

## මිනිසත්කම

කෙනෙකුගේ දුක නොහඳුන නුඹ
ඔහුගේම සතුට හඳුනා
ඊර්ෂ්‍යා කරයි වෛර කරයි
කෙනෙකුට වෙනස්කම් කරන නුඹ
ඔහුගේම සාධාරණය දැක
නොහැඟුනා සේ හිඳී
තමාට දුකක් විපතක් නොවන සේ සිටින නුඹ
දවසක විඳවයි අන් අයගේ දුක් කරදරයන්ට
යටි සිතින් සිනා සී ඔච්චම් කලාට
බලතල නිලතල නැහැ හැමදින
කාටත් උරුමයි දුක් කරදර
කාටත් ඇත සුන්දර සිහින
තේරුම් අරන් මනුස්සකම
අත්හරිනු තිරිසන් ගති
දායාද කරණු ලොවට
පිවිතුර මිනිසත් කම්

**සෙ/කිපු104364**
**සාසෙ බණ්ඩාර කේඑම්ඩීඑච්**
**23 ශ්‍රීලංජාආබමු**

## අහිමි පෙම

ඉරබටු තරුව ද
ඔබමය මට...
පහන් තරුව ද
ඔබමය මට...
මග පෙන්වූ
නොකැලැල් සිතින්...
මං මුලාවී සිටියදී
තෙරක් නොපෙනෙන
දිවි සයුරු තලයේ
පහන් ටැඹ
වූයේ නුඹමය...
දැන දිගුකල මානයේ
ඔබ බොහෝ දුරය මට
කිසිදා ලංවිය නොහැකි ලෙස...
සසල සයුර මම වෙමි
නිසල අහස ඔබමය...
එක්වෙනා ඔබ ඇත පෙනුනද
රුදුරු මායාවක්මය සිතිජය...

**සෙ/එච්101437**
**කෝප්‍රල් දිසානායක එස්එස්**
**15(සෙව්)විපාරෙ**

## ආදරෙයි තාත්තේ

ඔබ මා දුරයි අද බොහෝ ඈතයි
නොපෙනෙනා මතකයත් ඈතයි
සුවඳ සෙනෙහස තවම ඉතිරියි
ආදරෙයි මං තාත්තේ
ඔබෙන් වගෙ නෑ කිසිම දවසක
ලැබුනේ සෙනෙහස හද පිරෙන්නට
සෙවනැල්ල වී හැම මොහොතකම
සිටියෙ ඔබ මහ මේරක් ලෙසටම
කොතනක සිටියත් ගොස් අද
කඳුළු බිඳු දෙකපුල් තෙමන විට
එදා වගේ තුරුලු කරගෙන
පිරිමදිනවද මගේ හිස

**සෙ/25කිපු 00583**
**කෝප්‍රල් ප්‍රේමදාස ටීබී**
**25 ශ්‍රීලංජාආබමු**

## නුඹේ හඬ ...

ගිනි අව්ය තුරුළු කරගෙන
සිටියත් දැතින්
හදවත මොළකැටියි අම්මේ...

දැනෙයි දුක මට තදින්
පුතේ... යන නුඹේ
ආදර හඬ
සැමදා ඇසෙනවා හීනෙන්
නෙත් තෙමෙනවා නිතැතින්...

**සෙ/එච්101926**
**සාසෙ වික්‍රමසිංහ එම්පීජීආර්**
**16(සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුව**

# විරු කැකුළු
# හපන්කම්

**කුරුල්ලෝ ඉගිලෙනවා**



කේ. බී. පසිදු හිරාන් විජේවීර
ර/උඩුහත්ත මිහිඳු මහ විදුහල, ඇහැලියගොඩ.

**දළදා පෙරහැර**




එස්. එම්.ඩී විනුති රිවින්හාරා
2 ශ්‍රේණිය
සී.ඩබ්.ඩබ් කන්නන්ගර මධ්‍ය විදුහල, මතුගම

**සැදෑ කාළය**




එන්. එම්. විදුත් විමුක්ති මුනිප්‍රිය
5 ශ්‍රේණිය
ර/දියුරුම්පිටිය සමන් විදුහල

**සරුංගල් අරිනවා**



දෙව්මිණි කාවිද්‍යා බණ්ඩාර රත්දුනු
2 ශ්‍රේණිය
වප/බුවනෙකබා ප්‍රාථමික විදුහල, පොල්පිතිගම

**කුඹින්ගේ ලෝකය**




ඩබ්ලිව් ගිහංසා සුලක්ෂණී වීරසිංහ
නවෝද්‍යා පෙර පාසල
මීගස්වැව- නිකවැරටිය.

**කජු පුහුලම**



ආර්. ජී. දනිදු ධම්සර සස්මික නවරත්න
මහ/පුජාපිටිය ප්‍රාථමික විදුහල, මහනුවර

# HAPPY BIRTHDAY





දෙවන වියට පා තබන
**මෝක්ෂන දෙනුවන් කැකුලන්දර**
පුතුට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා තාත්තා ඇතුළු පවුලේ සැම...
සෙ/එච්100246 ලා/කෝ කැකුලන්දර කේඑම්එන්එල්බී.



තෙවන වියට පා තබන
**අයෝධ්‍යා චාන්දනී ඒකනායක**
දියණියට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා තාත්තා ඇතුළු පවුලේ සැම...
සෙ/16එච්00678 සාසෙ ඒකනායක ටීඩබ්ලිව්සී.



පසුගියදා පළමු වියට පා තැබූ
**යුරේනි දිල්හාරා යහම්පත්**
දියණියට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා තාත්තා ඇතුලු පවුලේ සැම...
සෙ/12එච්00974 කෝප්‍රල් යහම්පත් කේඑච්ටී



පසුගියදා පළමු වියට පා තැබූ
**එච්.එම්.අහස්නා එක්මිණි ජයසේකර**
දියණියට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා තාත්තා ඇතුලු පවුලේ සැමෙ...
ලා/කෝ ජයසේකර එච්එම්ජේ
හා
කෝප්‍රල් මංගලී එල්එන්එස්...



# ඒකක අභිමන් සමරමින්...

## 11(සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව



මඩකලපුව, කුරුක්කල්මඩම් ප්‍රදේශයේ ස්ථානගත 11(සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව සිය 23වන බළඇණි දිනය වැ.බ. අණදෙන නිලධාරි මේජර් ඊඩීටීපීඊ බණ්ඩාර ශ්‍රීලංසිරෙගේ ප්‍රධානත්වයෙන් පසුගිය අප්‍රේල් 25වන දින අභිමානවත් අයුරින් සමරන ලදී. බළඇණි දිනයට සමගාමීව අණදෙන නිලධාරි වෙත කඳවුරු සම්මාන මුරයක් පිරිනැමුණු අතර, ක්‍රීඩා තරඟාවලියක් සියලු නිල දිවාභෝජන සංග්‍රහයක් ඇතුලු අංග රැසක් එදින උත්සව කටයුතු අතරට එක්ව තිබිණි.

## 21 (සෙව්) ගැමුණු හේවා බළඇණිය



ආරක්ෂක සේනා මුලස්ථානය (වන්නි) යටතේ 2009.04.28 වන දින ආරම්භ කරන ලද 21 (සෙව්) ගැමුණු හේවා බළඇණිය සිය අටවන සංවත්සරය පසුගියදා සෙල්වරි, තලේයිමන්නාරම් කඳවුරේදී වැ: බ: අණදෙන නිලධාරී මේජර් පීපීජීපී ප්‍රේමදාස ගැහේබගේ ප්‍රධානත්වයෙන් සමරන ලදී. ආගමික වතාවත්වලට හා යුද හමුදා සම්ප්‍රදායන්ට මුල්තැනක් දෙමින් පැවති මෙම සංවත්සර උත්සවයේදී අණදෙන නිලධාරි වෙත කඳවුරු සම්මාන මුරයක් පිරිනැමීම, සියලු නිලදිවා භෝජන සංග්‍රහයක් පැවත්වීම, ආදි කටයුතු ප්‍රමුඛ විය.

## 16 (සෙව්) ගැමුණු හේවා බළඇණිය



තිස් වසරකට අධික කාලයක් අප මාතෘභූමිය වෙලාගත් ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමේ මානුෂීය මෙහෙයුමේ අවසන් අධියරට ළඟා වෙමින් සිටි අවධියේ ආරම්භ කරන ලද 16(සෙව්) ගැමුණු හේවා බළඇණිය පසුගියදා සිය 09 වන සංවත්සරය වැ.බ. අණදෙන නිලධාරි මේජර් ඩීවීවීඩබ්ලිව් දේශප්‍රිය ගේ ප්‍රධානත්වයෙන් අභිමානවත් අයුරින් සමරන ලදි. බොහෝ කාලයක් යාපනය අර්ධද්වීපයේ රාජකාරි කළ මෙම ඒකකය වත්මන වන විට ගාල්ල කොටුව කඳවුරේ ස්ථානගතව රාජකාරි සිදු කරනු ලබයි.

# ඒකක අභිමන් සමරමින්...



## 2 (සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදාව



ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ඉපැරණිම ඒකකය වූ 2(සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදාව සිය 136 වන සංවත්සරය ආගමික වතාවත් වලට මුල්තැන දෙමින් අරියාලේ ප්‍රදේශයේ දි පසුගියදා සමරන ලදී. 1922, 1954 සහ 1978 යන වර්ෂයන් තුලදි වර්ණ ලැබූ මෙම ඒකකය මේ වනවිට අණදෙන නිලධාරිවරුන් 39 ක් යටතේ රටදය සුරකීමේ කාර්යයට දායක වි තිබේ. එසේම මෙම ඒකකයේ රෙජිමේන්තු සැරයන් මේජර්වරුන් ලෙස 27 දෙනෙකු කටයුතු කොට ඇත. බළඇණි දින සංවත්සර කටයුතු අතර, අරියාලේ ප්‍රදේශයේ තෝරාගත් දිළිදු පවුල් 20ක් සඳහා ප්‍රණිත ආහාර වේලක් ලබාදීමට ක්‍රියා කිරීමද විශේෂත්වයකි.

## පුරෝගාමි බලකා රෙජිමේන්තුව



ස්වේච්ඡා බළසේනාවට එක්වූ දෙවන රෙජිමේන්තුව ලෙස යුද හමුදා පුරෝගාමි බලකා රෙජිමේන්තුව සිය මංගල සංවත්සරය පසුගියදා මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් කේසී ධර්මසේන ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් අභිමානවත් ලෙස සමරන ලදී. එහිදී රටදය වෙනුවෙන් දිවිපිදූ පුරෝගාමි සෙබළුන් සිහිකරමින් ඔවුනගේ පවුල්වල සමාජිකයින්ගේ සහභාගීත්වයෙන් පුරෝගාමි බළකා රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දැක්වීම, රුක් රෝපණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම, රෙජිමේන්තු මධ්‍යස්ථානය ගොඩනැංවීමට ශ්‍රම දායකත්වය දැක්වූ සමාජිකයින් හට ප්‍රණාම තිළිණ පත් ප්‍රදානය කිරීම ආදි වැඩ සටහන් රාශියක් ක්‍රියාත්මක කෙරිණ. මිට අමතරව යුද්ධ හමුදාධිපති ගේ සංකල්පයකට අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ ක්‍රියාත්මක කරනු ලබන "නිරෝගීමත් දැයක් නිරෝගිමත් හමුදාවක්" තේමා පාඨය මුල්කර ගනිමින් තේ පැන් සංග්‍රහයක් වෙනුවට පලතුරු සංග්‍රහයක් පැවත්වීමද විශේෂත්වයකි. තනි ඒකකයක් ලෙස පුරා වසර 57ක් පැවති ශ්‍රී ලංකා යුද හමුදා පුරෝගාමි බළකාය 2016.02.16 වන දින සිට රෙජිමේන්තු මධ්‍යස්ථානයකින් හා ඒකක දෙකක් වශයෙන් ප්‍රතිව්‍යුහගත වන ලදි.

## 16(සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුව



පලාලි වාසවිලාන් ප්‍රදේශයේ ස්ථානගත 16(සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුව සිය නවවන සංවත්සරය පසුගියදා වැ.බ. අණදෙන නිලධාරි මේජර් ඩීඑච්එම්ඩබ්ජේකේ හේරත් ශ්‍රීලංසිරෙගේ ප්‍රධානත්වයෙන් සමරන ලදි. අණදෙන නිලධාරි වෙත කඳවුරු සම්මාන මුරයක් පිරිනැමීම, ඒකකය ස්ථාපිත භූමියේ තැනූ නව බුදුමැදුර වෙත පිළිමවහන්සේ නමක් වැඩම කරවීම, සියලු නිල තේපැන් සංග්‍රහයක් හා සෙසුනිල දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වීමද බළඇණි දිනයට සමගාමිව එදින සිදුකරන ලදි.

# ජනසෙත සදමින්



## විරු දිවියට විරු සරණක්...



රටදය සුරකීමේ කාර්යට දායක වී රණක්ෂිතයට පත් රණවිරුවන්ගේ ජීවන තත්ත්වය උසස් කිරිමේ අරමුනින් යුද හමුදා සේවා වනිතා ශාඛාවේ මුල්‍ය දායකත්වය ඇතිව දිවයින පුරා ක්‍රියාත්මක රණවිරු නිවාස ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. එම ව්‍යාපෘතියට අදාළව 11 (සෙව්) ගජබා රෙජිමේන්තු අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් කේපීඑම් ද ඒ විජේසිංහ ගේ පූර්ණ අධීක්ෂණය යටතේ ඉදිකරන ලද නව නිවසක් පසුගියදා ගලෙන්බිඳුනුවැව පදිංචි 1 වන ගජබා රෙජිමේන්තුවට අයත්, සෙ/469419 කෝප්‍රල් අමරතුංග ආර්අයි හට පිරිනැමිණ. 11 (සෙව්) ගජබා රෙජිමේන්තු ඒකක සමාජිකයින්ගේ පූර්ණ ශ්‍රමදායකත්වයෙන් ඉතා කෙටි කලක් තුළ මෙම නිවස ඉදිකිරීම විශේෂත්වයකි.

## හෙට ලොව නුඹයි



යාපනය තෙලිප්පලේ ප්‍රදේශයේ ස්ථානගත 14(සෙව්) ගැහේබ ඒකකය විසින් එම ප්‍රදේශයේ දිළිඳු පාසලක් වන කීරමලේ නගුලේෂ්වරම් පාසලේ අධ්‍යාපනය ලබන දූ දරුවන් වෙනුවෙන් පාසල් උපකරණ බෙදාදීමක් පසුගියදා සිදුකරන ලදී. 14 (සෙව්) ගැහේබ වැ.බ. අණදෙන නිලධාරි මේජර් ඩීඑස් කණ්ඩබ්බි ගැහේබ ගේ මඟ පෙන්වීම මත සංවිධානය කෙරුණු මෙම ප්‍රජා සත්කාරය සඳහා කොළඹ ප්‍රදේශයේ ධානපතියෙකු වූ ඉෂාන් පෙරේරා මහතා සහ එම මැතිණිය විසින් මුල්‍යමය දායකත්වය ලබාදීමට ක්‍රියාකර තිබුණි.

## අතහැර නොයන මෙහෙවර

පසුගියදා දිවයිනට බලපෑ අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් අවතැන් වූ ජනයා වෙත සහන සැළසීමේ කටයුතු සඳහා ආරක්ෂක හමුදාව විසින් සුවිශේෂී දායකත්වයක් දක්වන ලදී. විශේෂයෙන් ගංවතුර හා නායයෑම හේතුවෙන් අසරණ වූ ජනයා ආරක්ෂක ස්ථාන වෙත රැගෙන යෑම, ඔවුනට අවැසි ආහාරපාන හා වෛද්‍ය පහසුකම් සැපයීම මෙන්ම මියගිය අයගේ මෘතදේහ සොයා මෙහෙයුම් කිරිම ආදී කටයුතු මේ අතර ප්‍රධාන විය. මෙලෙස අවතැන් වූ මාතර දිස්ත්‍රික්කයේ ජනයා වෙත සහන සැලසීමේ ප්‍රමුඛ කාර්යභාරයක් 3 (සෙව්) ගැමුණු හේවා බළඇණිය විසින් සිදුකළ අතර, මාතර, කඹුරුපිටිය, අකුරැස්ස, මොරවක ආදි ප්‍රදේශයන්හි ජනතාවගේ සහන කටයුතු මෙම ඒකක හට පිරිස් මැදිහත් වීමෙන් සිදුකරන ලදී.





# ජනසෙත සදමින්



## අතහැර නොයන මෙහෙවර





පසුගියදා දිවයිනට බලපෑ අයහපත් කාලගුණය හේතුවෙන් අවතැන් වූ හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් වීරකැටිය, අගුණකොලපැලැස්ස, වලස්මුල්ල, තංගල්ල, බෙලිඅත්ත, ඕකේවෙල සහ කටුවන යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි අවතැන් ජනයා වෙත සහන සැලසීමට 3 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු සෙබළුන් ක්‍රියා කළේය. එහිදි අවතැන් ජනයා ආරක්ෂිත ස්ථාන වෙත රැගෙන යෑම, අතුරුදහන් පුද්ගලයින් සොයා යෑම. විනාශයට පත් වූ මාර්ග, වැව් අමුණු පිළිසකර කිරීම ආදි සහන සේවාවන් රැසක් සඳහා එම ඒකක අපදා සහන කණ්ඩායම් දායක වූහ.

## සිසු දිවියට සවියක් වී





ආරක්ෂක සේනා ආඥාපති (නැගෙනහිර) මේජර් ජෙනරාල් නන්දන සේනාධීර ඩබ්ලිව් ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ මගපෙන්වීම මත පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැලිකන්ද, සිංහපුර ප්‍රාථමික විද්‍යාලයේ අධ්‍යාපනය ලබන සිසු දරුදැරියන් 150 ක් සඳහා පාසල් උපකරණ බෙදාදීමක් පසුගියදා සිදුකෙරිණ. මෙම සත්කාර්යය සඳහා කොළඹ ප්‍රදේශයේ සුප්‍රසිද්ධ වෙළඳ ව්‍යාපාරිකයෙකු වූ දානපති ශානක පෙරේරා මහතා සහ ඔහුගේ පවුලේ ඥාතිහු අනුග්‍රහය දැක්වූහ. මෙම අවස්ථාවට මහා සංඝරත්නය හා 233 බළසේනාවේ බළසේනාධිපති ඇතුළු යුද හමුදාවේ ජ්‍යෙෂ්ට නිලධාරිහු රැසක්ද, ගුරු භවතුන් හා පාසල් ළමුන් රාශියක්ද එක්වූහ.

## හරිත ලොවක් තනා ගනිමු



මඩකලපුව කලෙයිවාන ප්‍රදේශයේ ජීවත්වන දිළිඳු ජනයාගේ ජීවන තත්ත්වය නංවාලීමේ අරමුණ පෙරදැරිව පසුගියදා 11 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ මැදිහත්වීමෙන් කජු පැළ බෙදාදීමේ උත්සවයක් කලෙයිවාන පාසලේදි පැවැත්විණි. 11 (සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු වැ.බ. අණදෙන නිලධාරි මේජර් ඊඩීටීපීඊ බණ්ඩාර ගේ ආරාධනයෙන් මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 231 බළසේනාවේ බළසේනාධිපති බ්‍රිගේඩියර් එන්ඩීඑස්පී නිවුන්හැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එක්විය. මෙහිදි මඩකලපු දිස්ත්‍රික්කයේ ප්‍රදේශිය ලේකම් කොට්ඨාශ 04ක් ආවරණය වන පරිදි සිවිල් වැසියෝ 400 දෙනෙකු වෙත කජුපැළ 2000 කට අධික ප්‍රමාණයක් ලබාදීමට ක්‍රියාකරන ලදී.

# ආධ්‍යාත්මික සුව පතා

## අටවිසි බෝධි ප්‍රාකාරය විවර කරමින්



මඩකලපුව සින්නවත්ත ශ්‍රී පන්ථාරාම විහාරස්ථානයේ අභිනවයෙන් ඉදිකරන ලද අටවිසි බෝධි ප්‍රාකාරය විවෘත කිරීම හා එම විහාරස්ථානයට ධාතු කරඬුවක් පූජා කිරීමේ පුණ්‍යෝත්සවයක් 2017.05.05 වන දින 23 සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්ඩබ්ලිව්එස්ඩීබී පනන්වල ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් සිදුකරන ලදී.

විහාරාධිපති පූජ්‍ය දේවාලේගම කුසලානන්ද හිමියන්ගේ ඉල්ලීම පරිදි 231 බළසේනාවේ බළසේනාධිපති බ්‍රිගේඩියර් එන්ඩීඑස්පී නිවුන්හැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ මඟ පෙන්වීම මත 11 (සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු වැ.බ. අණදෙන නිලධාරි මේජර් ඊඩීටීපීඊ බණ්ඩාර ගේ අධීක්ෂණය යටතේ එම ඒකක රණවිරුවන්ගේ නිර්මාණශීලී ශ්‍රමදායකත්වයෙන් ඉදිකරන ලද මෙම අටවිසි බෝධි ප්‍රකාරය සඳහා විහාරස්ථාන දායක දායිකාවන් මෙන්ම අවට ගම්වාසීන් ද මූල්‍යමය දායකත්වය සපයන ලදී.

## පිංබිමක සැරිසරා

තිස්සමහාරාම, කාවන්තිස්සපුර ප්‍රදේශයේ ස්ථානගත 3 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ සේවයේ නියුතු නිලධාරින්ගේ හා සෙසුනිලයින්ගේ පවුල්වල සමාජිකයින්ගේ සහභාගීත්වයෙන් පසුගියදා කතරගම පුජාභූමිය වන්දනාමාන කිරීමේ පුණ්‍ය කටයුත්තක් සිදුකරන ලදි.

ඒකක අණදෙන නිලධාරි මේජර් එස්එස්එම් දිසානායක ශ්‍රීලංජාආබමු ගේ මගපෙන්වීම මත සිදුකෙරනු මෙම පුණ්‍ය කටයුත්තේදී කතරගම ඓතිහාසික කිරිවෙහෙර රජමහා විහාරය, රුහුණු මහා කතරගම දේවාලය, අෂ්ඨඵල බෝධිය වන්දනාමාන කිරීම හා සෙල්ල කතරගම පුජා භූමිය වන්දනාමාන කිරීම සිදුකරන ලදි.

## සර්වඥ ධාතු තැන්පත් කිරිමේ පුණ්‍යෝත්සවය



ක්‍රිස්තු පූර්ව දෙවන සියවසට අයත් බවට පුරාවිද්‍යා කැනීම් වලින් සනාථ කර ඇති තෝපුර්, ප්‍රදේශයේ පිහිටි පෞරාණික සිරිවඩ්ඩනාරාම චෛත්‍ය රාජයාණන් වහන්සේ ප්‍රතිසංස්කරණය කිරිමෙන් පසු එහි සර්වඥ ධාතු තැන්පත් කිරීමේ පුණ්‍යෝත්සවය පසුගියදා 22 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේපීඒ ජයසේකර ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් සිදුකරන ලදි.

24 ශ්‍රීලංජාආබමු අණදෙන නිලධාරි මේජර් එම්ජ්සීපී මාරසිංහ ශ්‍රීලංජාආබමු ගේ මඟ පෙන්වීම මත එම ඒකක භට පිරිස් මෙම චෛත්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා දායකත්වය දැක්වූහ. මෙම අවස්ථාවට 224 බළසේනාවේ බළසේනාධිපති කර්නල් ඩබ්ලිව්ආර්එම්එම් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ඇතුළු ප්‍රදේශයේ සම්භාවනීය අමුත්තෝ රැසක් ද එක්වූහ.



# ආධ්‍යාත්මික සුව පතා

## බොදු උරුමයේ අරුමය





පේදුරුතුඩුව තික්කම් ප්‍රදේශයේ ස්ථානගත 18 (සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදාව මෙවර පොසොන් පෝය මුල්කර ගනිමින් එම ප්‍රදේශයේ ජීවත්වන සිවිල් වැසියන් වෙත බත් දන්සැලක් පැවැත්වීමට කටයුතු කොට තිබුණි. ජාතින් අතර, සුහදත්වය වර්ධනය කිරීමට මෙන්ම එකිනෙකා ගේ සංස්කෘතික උරුමයන් වටහා ගැනීමට මෙවැනි සත් ක්‍රියාවන් හේතුවන බව පැවසිය හැක. මෙම බත් දන්සැල සඳහා තුන්දහස ඉක්මවූ සිවිල් වැසියන් පිරිසක් එක්ව සිටීම විශේෂත්වයකි.

## තෙමඟුල සමරා



පොළොන්නරුව නව නගරය කේන්ද්‍ර කොට සම්බුදු තෙමඟුල සිහිකරමින් නැගෙනහිර ආරක්ෂක සේනා අඟාපති ගේ උපදෙස් මත පවත්වන ලද 2017 වෙසක් කලාපය සඳහා 17 (සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදා විසින් ඉතා දර්ශණීය පහණ් කුඩුවක් ඉදිරිපත් කරන ලදි. 17 (සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදා ඒකක අණදෙන නිලධාරි මේජර් ජේර්එල් ද සොයිසා ශ්‍රීලපාහගේ අධීක්ෂණය යටතේ මෙම දර්ශණීය පහන් කුඩුව නිර්මාණය කරන්නට යෙදුණි.

## සෙබළ සිත් නිවා සැනසුමට

මහනුවර කුණ්ඩසාලේ ප්‍රදේශයේ ස්ථානගත 5(සෙව්) බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදා කඳවුර තුළ රෝපණය කර ඇති බෝධින් වහන්සේ වටා ඉදිකරන ලද අලංකාර බෝධි ප්‍රාකාරය දෙදහස් පන්සිය හැටහය වන සම්බුදු තෙමඟුල සිහිකරමින් පසුගියදා අණදෙන නිලධාරි මේජර් ටීඑම්ආර්කේ තෙන්නකොන් විසින් නිරාවරණය කරන ලදී.



# විශිෂ්ටයන් අතර
# විශිෂ්ටයෙකු වී



ත්‍රිකුණාමලය ක්ලැෆන් බර්ග් හි ස්ථාපිත හටකාර්ය සම්පාදක පුහුණු පාසල වෙතින් පවත්වනු ලැබූ තෙවන භකාස මාණ්ඩලික නිලධාරි (Logistics Staff Course) පාඨමාලාව සාර්ථකව හැදෑරීමට 8 (සෙව්) ඉංජිනේරු සේවා බලකායට අයත් නි/6480 මේජර් යූඩබ්ලිව් ප්‍රියන්ත කුමාර සමත් විය. මෙම පාඨමාලාව සඳහා නිත්‍ය හමුදා නිලධාරින් 23ක් ද, විදේශිය නිලධාරි 02ක් ද සහභාගි වූහ. මාස 15ක් පුරා පැවැත් වූ මෙම පාඨමාලාව තුළින් හට කාර්යය සම්පාදනය පිළිබඳ න්‍යායාත්මක පුහුණුවක් ලබාදීම සිදුකරනු ලැබේ.

අදාළ පාඨමාලව හැදෑරූ නිලධාරින් සඳහා උපාධි ප්‍රදානය කිරීමේ උත්සවය පසුගියදා ආරක්‍ෂක සේවා විද්‍යාලයයේදී යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් ඒඩබ්ලිව්ජේසී ද සිල්වා ආර්ඩබ්ලිව්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ.



දියතලාව ස්වේච්ඡා පුහුණු පාසල වෙතින් පැවැත්වූ සරඹ සංස්කරණ පුහුණු පාඨමාල අංක 32 හැදෑරූ 15 (සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට අයත් සෙ/15ඊ01143 කෝප්‍රල් ජයවර්ධන කේඑච්එම්ජී එහි ප්‍රථම ස්ථානය දිනාගන්නා ලදී.



වත්තල රණවිරු සම්පත් කේන්ද්‍රය මගින් පැවැත් වූ යතුරු පැදි ශිල්පී පාඨමාලව 2016 දෙවන අධියරට සහභාගී වූ 15 ශ්‍රී ලංකා සිංහ රෙජිමෙන්තුවට අයත් සෙ/15ඊ01790 රසෙ වෙළගෙදර ඩබ්ලිව්එම්සී එම පාඨමාලවට සහභාගී වූ සෙනින් 121 දෙනෙකු අතුරින් ප්‍රථම ස්ථානය හිමිකර ගැනීමට සමත් විය.



ස්වේච්ඡා පුහුණු පාසල දියතලාව වෙතින් පවත්වන ලද විධායක අධිකාරි පාඨමාලා අංක 14 සඳහා සහභාගී වූ 19(සෙව්) බළඇණිය ගජබා රෙජිමේන්තුවට අයත් නි/8553 කපිතන් ඒජ්කේ බණ්ඩාර එහි ප්‍රථම ස්ථානය දිනාගන්නා ලදී.




බුවැලිකඩ ශ්‍රී ලංකා යුද හමුදා සංඥා පුහුණු පාසල වෙතින් පැවැත් වූ වෙනත් ඒකක සඳහා වන සංඥා පුහුණු පාඨමාලව හැදෑරූ 15 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට අයත් සෙ/ඊ101187 රසෙ ජයවීර ජේඑච්එම්ආර්කේ එහි ප්‍රථම ස්ථානය හිමිකර ගන්නා ලදී.



3(සෙව්) ශ්‍රීලයුකාබ අණදෙන නිලධාරිණී මේජර් එල්ආර්ටීඑන් ලියනගේ 2017 මාර්තු 30 දින සිට මැයි 03 දින දක්වා ඇමෙරිකාවේ "හවායි" හි පැවති උසස් ආරක්‍ෂක සම්බන්ධිකරණ පාඨමාලාවට සහභාගී විය. එම පාඨමාලාව හැදෑරූ ප්‍රථම ස්වේච්ඡා නිලධාරිණිය ලෙස ඇය ස්වේච්ඡා බලසේනාවට අභිමානයක්ද ගෙන දුන්නාය.

# රස කැලි



## පිරිමි අඳුම් විතරයි

විනිසුරු :- මේ රෙදි හොරකම කරද්දි තමාගේ අහිංසක බිරිඳවයි දුවල දෙන්නවයි මතක් වුනේ නැද්ද?.

විත්තිකරු :- අනේ ස්වාමිනි මට මතක් නොවුණා නොවෙයි. එත් ... ඒ සාප්පුවේ තිබුණේ පිරිමි ඇඳුම් විතරයි.

## උපන් දිනේ

සිය සේවාස්ථානයේ අයිතිකරුගේ හැටඅට වෙනි උපන්දින උත්සවයට පැමිණි සේවකයෙක් මෙසේ කීවේය.

"සර් මං හිතනවා මට සර්ගේ මීළඟ උපන්දින උත්සවයටත් එන්න පුළුවන් වේවී කියලා"

සේවාස්ථාන අයිතිකරු "ඔබ බොහෝම තරුණ කෙනෙක්. ඔබට එන්න බැරිවෙන එකක් නැහැ. මට පේන විදියට ඔබ හොඳ නීරෝගී කෙනෙක්නෙ"

## ඔරලෝසුව

දවසක්දා මිනිහෙක් එයාගේ අලුතෙන්ම ගත්ත කාර් එකේ ගමනක් යද්දි හදිසියේම කාර් එක හැප්පුනාලු. ටික වේලාවක් යද්දි එතනට පොලිස් රාළහාමි කෙනෙක් ආවා.

"බලන්න සර් මම ලක්ෂ පනහකට ගත්ත අලුත්ම කාර්එක කුඩේ කුඩු උනා. අනේ දෙයියනේ මගේ සල්ලි..."

"හරි හරි කාර් එක ගැන පස්සේ බලාගමු. බලන්න ඔයාගේ එක අතක් වෙන්වෙලා... ඉක්මනට යමු බෙහෙත් කරන්න."

මිනිහා අත දිහා බැලූ පසු...

"අනේ දෙයියනේ කෝ මම ලක්ෂ පහකට ගත්තු අලුත් ඔරලෝසුව"

## අපි දැක්කා

බංගලාවක සියළුම දෙනා පැජරෝවක නැගී හවස හයට පමණ සුට්කේසද පටවා ගෙන ගිය හැටි ගෙවල් බිඳින්නා බලා සිටියේය.

ඔහු අසල් වැසියන් නිදාගත් පසු තාප්පයෙන් පැන දොරක් ඇරගෙන ගේ තුළට වැදුණි. මොහොතකින් "ඔබව මටත් පේනවා. සාජන්ටත් පේනවා" යැයි කියනු ඇසුණි. හොරා තිගැස්සුණි. ඔහු නැවත වරක් අඩි දෙකක් ඉදිරියට තැබුවේය. "ඔබව මටත් පේනවා. සාජන්ටත් පේනවා" යැයි කියනු නැවතත් ඇසුණි.

එවිට හොරා තම අත තිබූ පෙන්ටෝච් එක දල්වා ශබ්දය ආ දිසාවට එල්ල කළේය. ඒ ශබ්දය කූඩුවක සිටි ගිරවෙකු ගේ බව ඔහුට පෙනුණි.

"මෝඩ ගිරවා කටවහගෙන හිටියේ නැත්නම් බෙල්ල කරකවලා දානවා." යැයි හොරා ගිරවාට තර්ජනය කළේය.

"සාජන් දූන් තමයි වේලාව මුව කාලදාපන්" යැයි ගිරවා කීය.

අසල නිදා සිටි ඇල්සේෂන් බල්ලා හොරාගේ බෙල්ලටම පැන්නේය.

## ඇණෙ ගැසීම

"පුතේ බලාගෙන ඇණේට ගහන්ට"
මිටියකින් ඇණයකට ගසමින් සිටි තම පුංචි පුතුට මව කෑ ගසා කිව්වාය

"බයවෙන්න දෙයක් නැහැ අම්මේ. ඇණේ අල්ලගෙන ඉන්නේ නංගි"

## තේරුම

තේ කඩයකට ගොඩ වැදුනු තරුණයෙක් තේ කොප්පයක් ඇණවුම් කොට බීමට සැරසුණා පමණි.

තරුණයා :- "ඕයි වේටර් මෙහෙ එනවා. මේ බලවා මේ තේ කෝප්පෙ ඇතුලේ මැස්සෙක් ඉන්නවා. මොකක්ද ඕයි මේකේ තේරුම"

වේටර් :- "අනේ සර් මම නං දන්නේ නෑ. මම වේටර් කෙනෙක් විතරයි. ඔය එක එක නිමිති වල තේරුම කියලා දෙන්න මම සාත්තරකාරයෙක් නොවෙයි."

# බුදු දහම තුළින්
# රෝග සුවය හා මානසික සහනය




ඇය කිසාගෝතමී නම් විය. උපතින්ම කෘෂ හෙවත් සිහින් සිරුරකට හිමිකම් කියු බැවින් කිසාගෝතමිය විය. ඇය දිළිඳු දූරියකි. එබැවින් විවාහ වූ පසුවද ඇය ගේ දුගී දුප්පත්කම් හේතුවෙන්ම සැමියාගේ පාර්ශවයේ ඥාතින්ගේ අඩම්තේට්ටම් හා නිග්‍රහයට නිරතුරුව භාජනය විය. එසේ වූවද වාසනාවකට මෙන් ඇය පුතෙකු බිහිකළ බැවින් මෙතෙක් අපහාස කළ පාර්ශ්වයන්ගේ ගෞරවයටත් ප්‍රසාදයටත් පාත්‍රවිය. ඇගේ කුළුඳුල් දරුවා කාගෙත් අවධානයට හා ආදරයට ලක්ව දුවපැන සෙල්ලම් කරන අවධියේ එක් දිනක් හදිසියේ මරණයට පත්විය. මෙම මරණය කිසාගෝතමියට කෙසේවත් දරා ගැනීමට නොහැකි විය. මේ හෙතුවෙන් ඇය ඉමහත් කම්පනයට පත් වූ අතර, දරා ගැනීමට නොහැකි වේදනාවෙන් කෑමොර දුන්නාය. දරුවා නිසා තමා ලද සහනයත්, සතුටත්, ප්‍රීතියත් අවසන් වන දුටු කිසාගෝතමිය දැඩි මානසික පිඩාවකට ලක්වූවාය. මෙවැනි තත්ත්වයට පත් බොහෝ දෙනෙකුට සිදුවන ආකාරයෙන්ම ඇය ද යම් මානසික විකෘතිතාවයක් ප්‍රකට කරමින් දරුවාද කරපින්නාගෙන මියගිය තම පුතුට ප්‍රතිකාරයක් පතා හිස හැරුණු අතේ දිවගියාය. දරුවාගේ ක්ෂණික මරණය පිළිගැනීමට හෝ දරා ගැනීමට ඇය අපොහොසත් වූවාය. ඇය මෙම මානසික ව්‍යාධි තත්ත්වයෙන් පෙළෙමින් ගෙයක් ගානේ නගරයක් නගරයක් ගානේ ගියාය. දරුවාට නැවත පණ ලබාදෙන ලෙස ඉල්ලා සිටියාය. බොහෝ මිනිසුන් ඇයව දුටුවේ පිස්සියක් ලෙසිනි. එබැවින් බැණ වැදුණේය. ගල්මුල් වලින් දමා ගැසුවේය. මේ හේතුවෙන් ඇය තව තවත් විකෘතිතාවයට පත් වූවාය. එනමුදු එක් නගරයක විසූ නැණවත් පුද්ගලයෙකු ඇය අමතා නිසි ප්‍රතිකාරයක් ලබා ගැනීමට නම් නුදුරේ වැඩ වසන බුදුරජාණන් වහන්සේ වෙත යන ලෙස දන්වා සිටියේය. කිසාගෙ ්තමිය ඉමහත් බලාපොරොත්තු සහිතව බුදුන් වහන්සේ සොයා ගියාය.

බුදුන් වහන්සේට කිසාගෝතමිය පත්ව සිටි මානසික ව්‍යාධි තත්ත්වය අවබෝධ කරගැනීමට අපහසු නොවීය. උන්වහන්සේ ඇය අමතා "නැගෙණියනි දරුවාට ප්‍රතිකාර පිණිස නගරයට ගොස් නොමළ ගෙයකින් අබ මිටක් රැගෙන එන්න"යි පවසා ඇය පිටත්කර හැරියේය. කිසාගෝතමී ඉමහත් සතුටට පත් වී දිව ගියාය. ඇය නගරයේ පළමු ගෙට ගියාය. "මගේ දරුවාට ප්‍රතිකාර ගැනීමට අබ මිටක් අවශ්‍යයි...! බුදුන් වහන්සේ එය රැගෙන එන ලෙස මාහට දැන්නුවා"

"මොහොතක් ඉන්න. කඩිනමින් රැගෙන එන්නම්" නිවැසියා පැවසීය.

"ඉන්න ...! මේ නිවසේ කවුරුන් හෝ මියගොස් සිටීද?"

"ඔව්...! මේ නිවසේ සිටි අපගේ පරපුරට අයත් මියගිය ගණන කිව හැක්කේ කාටද?. මීට මසකට කලිනුත් අපගේ වැඩිහිටියෙකු මියගියා ..."

"එහෙමද...?" ඇය නැවතත් ඊළඟ නිවසට දිව ගියාය. මෙසේ ඇය අබ මිටක් සොයාගිය නිවෙස් ප්‍රමාණය අති මහත්ය. ඒ සෑම නිවසකින්ම ලැබුණේ එක හා සමාන පිළිතුරකි. මෙසේ ගෙන්ගෙට ගොස් විමසීමේ දී ඇය යථා තත්ත්වයට පත් වූවාය. මරණය යනු මේලොව ඉපදෙන කාහටත් පොදු දෙයක් බවත්, එය තමාට හෝ තම පුතුට පමණක් හිමි වන දෙයක් නොවන බවත්, යථාපරිදි අවබෝධකොට ගත්තාය. මෙම ලෝක ධර්මතාවය අනුව මෙම නගරයට හෝ සමස්ථ රට වැසියන්ට පමණක් නොව මුළු විශ්වයේ සියලු ඉපදෙන්නන්ට මරණය හිමිවන බව තේරුම් ගත්තාය. මරණයේ පොදු විශ්ව ව්‍යාප්තිය තේරුම්ගත් ඇයට තම ශෝකය තුනීකර ගන්නට හැකිවිය.

තමාට ගෙයින් ගෙට ගොස් නොමළ ගෙයකින් අබ මිටක් සොයාගෙන පැමිණෙන ලෙස බුදුන්වහන්සේ පිටත්කර හැරියේ මරණයේ මෙම යථා ස්වරූපය අවබෝධකර දීමට නොවේදැයි කිසාගෝතමියට වැටහුණි. ඇය සොහොනට ගොස් දරුවා මිහිදන්කර නැවත බුදුන් සොයා ගියාය. "නැගෙනියනි, අබ සොයා ගත්තේද...!? බුදුන්වහන්සේ විමසීය.

"ස්වාමිණි.. මා ගෙයින්ගෙට ගොස් අබ ඉල්ලා සිටියෙමි. ඇති තරම් අබ සොයා ගැනීමට හැකිවූවත්, නොමළ ගෙයකින් අබ මිටක් සොයාගැනීමට මාහට නොහැකි විය. ඒබැවින් මම අබ සෙවීම අත්හලෙමි...! නුඹ වහන්සේ මා යථාතත්වයට පත්කළ සේක. මා නුඹ වහන්සේ ගේ සරණ යමි...!" කිසාගෝතමිය පැවසුවාය.

මෙතෙක් මෙලොව බිහිවූ ශ්‍රේෂ්ඨතම මනෝ වෛද්‍යවරයා බුදුන් වහන්සේය. "ආරෝග ‍‍‍‍ය‍ා පරමාලාභා" වශයෙන් දේශනාකර වදාළ උන්වහන්සේ මෙලොව ජීවත්වන්නන්ට උතුම්ම ලාභය නිරෝගීකම බව දේශනාකර වදාළේය. එසේම යම් අයෙකුගේ නිරෝගීකම නැති කරන රෝගී තත්ත්වයන් මානසික රෝග හා කායික රෝග වශයෙන් කොටස් දෙකක් පවතින බැව් පෙන්වා දුන්නේය. ඒ අනුව පෘතග්ජන මිනිසුන් මුහුණ දෙන මානසික රෝගී තත්ත්වයේ යථා ස්වභාවය හැඳින නිසි ප්‍රතිකාර ලබාදීමට උන්වහන්සේ ක්‍රියාකර ඇත්තේ දක්ෂතම මනෝ වෛද්‍යවරයෙකු ලෙසිනි.

තම එකම පුතු මළ ශෝකයෙන් දැඩි මානසික කම්පනයකට හා මානසික විකෘතිතාවයට පත්වූ කිසාගෝතමියට සෘජු උපදේශනයක් නොව ප්‍රායෝගික ක්‍රියාකාරකමක් මගින් වක්‍රාකාරව ප්‍රතිකාරයක් හා ගැඹුරු අවබෝධයක් ලබාදීමක් මෙහිදී සිදුවී ඇත. තම පුතු මියගිය කරුණ මානසිකව පිළිගත නොහැකිව ඒ පිළිබඳ අතාර්තික විශ්වාසයක් ගොඩ නගාගෙන වෙහෙසුණු කිසාගෝතමියට එම අතාර්තික විශ්වාසය ක්‍රමානුකූලව දුරුවෙන ආකාරයේ ඉතා සාර්ථක ක්‍රමෝපායක් මෙහිදි භාවිතා වී ඇත. මනෝචිකිත්සක දෘෂ්ටිකෝණයෙන් බලන විට මෙම සිදුවීම තුළ මනෝවිද්‍යාත්මක වටිනාකම් රාශියක් දැකගත හැකිය.

බුදුරජානන් වහන්සේ කිසාගෝතමියට අනුදන වදාලේ ප්‍රයෝගික ක්‍රියාකාරකමකි. කිසාගෝතමිය ඒ වන විට පත්ව සිටි මානසික තත්ත්වය සෘජු උපදේශනයකට සුදුසු තත්ත්වයක් නොවේ. කිසාගෝතමිය ගේ මානසික අසමතුලිත තත්ත්වය දුරු කිරීමට සරල ක්‍රියාකාරකමක් තෝරා ගැනීම මෙහි ඇති එක් විශේෂත්වයකි.

කිසාගෝතමිය ගේ ක්‍රියාකාරකම ලෙස අබ සොයාගෙන ඒමට නිර්දේශ කිරීම තුළද විශේෂ වැදගත් කමක් ඇත. අබ යනු ඖෂධීය ගුණයක් සහිත දෙයක් සොයාගෙන එන ලෙස නිර්දේශ කළ විට කිසාගෝතමිය එම ක්‍රියාකාරකම විශ්වාස කිරීමට පෙළඹේ. එසේම අබ ඖෂධයක් සේම කුළු බඩුවක් වන නිසා සෑම නිවසකම ඇති සුලභ දෙයක් විය. ඒ සුලබ බව නිසා කිසාගෙ ‍ෟතමියට නගරයේ සෑම නිවසකටම යෑමට අවස්ථාව සැළසුනි. ඒ හරහා බුදුරදුන්ට අවශ්‍ය පණිවුඩය සෑම නිවසකින්ම කිසාගෝතමිය ට අසන්න ලැබුණි. එනම් මරණය තමන් ගේ පුතුට සීමාවූවක් නොව කාටත් පොදු සාමාන්‍ය ධර්මතාවයක් බවයි. ඖෂධීය ගුණයත්, සෑම නිවසකම සුලභ වීමත්, යන ලක්ෂණ දෙකම දරණ අබ මේ ක්‍රියාකාරකම සඳහා තෝරා ගැනීම ඒ අනුව පුළුල් මනෝවිද්‍යාත්මක අර්ථයකින් යුතුය.

මෙම ක්‍රියාකාරකමේ ස්වාභාවය අනුව කිසාගෝතමිය චිකිත්සාවට ලක්වන්නේ පුළුල් සමාජ පරිසරයක් තුළ ය. ඇයගේ වැරදි විශ්වාසය දුරුවීම හා ගැඹුරු අවබෝධයක් ලැබීම ඇගේ අභ්‍යන්තරය තුළ සිදුවූවත්, මේ සඳහා අවකාශ සැලසෙන්නේ සමාජ පරිසරය තුළ ය. එය හුදකලා පරිසරයක සිදුවන්නක් නොවේ. මෙවැනි මානසික කම්පනයකට පත්වූ කෙනෙකු හුදකලා නොකර, සමාජ ආරක්ෂාව ලබාදීම ඉතා වැදගත්ය. බොහෝ නිවෙස් වලට ඇය යෑම, ඒ නිවෙස්වල අය සමග කථා කිරීම, ඒ අයගේ මියගිය අය ගැන තොරතුරු පැවසීම යන ක්‍රියාකාරකම් තුළින් කිසාගෝතමියට සමාජ පරිසරය හා මුහුවීමේ අවස්ථාවක් සැළසේ. ඒ අතර තුර ඇයගේ මානසික තත්ත්වය හා අවබෝධය වෙනස් වේ. බුදුරදුන් අපේක්ෂා කළ ඇගේ මානසික පරිවර්ථනය සමාජ පරිසරය තුළ සිදුවීමට අවස්ථාව සැළසීම ද, මේ සිදුවීමේ විශේෂ වැදගත් කමකි. (බෞද්ධ මනෝවිද්‍යාව)

"මහණෙනි.. මම රාගාදී කෙලෙස් මුල් උදුරාදමන ශල්‍ය වෛද්‍යවරයෙක්මි- බුදුන්වහන්සේ

(ඉතිවුත්තක පාලිය)

**කර්නල් එම්පීජී පෙරේරා**
ජ්‍යෙෂ්ඨ කර්නල් සම්බන්ධීකරණ නිලධාරි
ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර)

කවි

# උල්පත



## නොනිමි මෙහෙවරට දැක්වූ කෘත ගුණ

එකම රටක දේශසීමාවක් තනන්ට වෙර දරූ          බෙදුම්වාදය
මිනිසත්කමට නිගාදුන් ඒ කෲර පාපතර          ත්‍රස්තවාදය
කුමකටද යලිත් තරුණ දැතට අවි ලබාදුන්          ජාතිවාදය
ලොව ජයගත් කිසිත් නැත නැති තැන          අවිහිංසාවාදය

වෛරය වැපිරූ යුධ ගිනිදැල් නිමාවූ          තැනසිට
කරුණාව මෛත්‍රිය දයාව වඩවයි මිනිස් හදවත්          තුළට
ධනය බලය උස්මිටි පහත්කම් නැත මානව          දයාවට
මෙය නිසි නිදසුනකි උතුරත් දකුණත් ඇතුළු සැම          දිසාවට

**නිමිත්ත:-**
**තම ජීවිතය බේරාගැනීමට දිවිදුන් පොලිස් සැරයන් සරත් හේමචන්ද්‍ර මහතාගේ පශ්චාත් මරණ පරීක්ෂණය පවත්වන අවස්ථාවේදී එයට එක්වූ යාපනය මහාධිකරණ විනිසුරු මානික්කවාසගර් ඉලංචේලියන් මහතා මියගිය පොලිස් සැරයන්වරයාගේ බිරිඳට වැඳ ආචාර කොට හඬා වැලපුනි.**

**මේජර් ආර්.පී.ආර් ගමගේ**
**ස්වේච්ඡා බලසේනා මුලස්ථානය**
**කොස්ගම.**

## වේදනා ඉකි බිඳියි



සඳ දිදුලන රැයේ
බලා සිටියා
නෙතු රිදෙන තුරා
ඔබ එනු ඇතැයි සිත සිත
ජනෙල් කවුළුව ලඟට වී

නිසංසල බිමක රෑ
තුරු වදුල යටට වී
දොඩමලු වූ පෙම් වදන්
බොල් සුළඟෙ විසිරී ගියා
දවයි හදවත ඉකිගසයි බැස
නිදිවරණ රැය පුරා
පාළුවට ගිය සුසාන භූමිය සේ
මගේ ලොව මිලින වී මියදුනා
හිසට අත තබා
දිවිරලා දුන් වදන්
සුණුවිසුණු කර දැම්මේ ඇයි
මහද ගිනි අවුලලා

**ශාන්ත සමරසිංහ**
**577/6**
**නුවරඑළිය පාර**
**පුස්සැල්ලාව**

## අහිමි නුඹ

මා හද සොරාගත්
නුඹට මා පෙම් කළ බව
නුඹ නොදන්නේ...

පෙම් හසුන් පුදකලත්
නොගත්තට තරහක් නෑ
දැනුනේ...
සත්තමයි පැංචියේ

මේ ඉරිදා දහම් පාසලේදී
විසේකාර රුවැත්තිගේ
මුව දකින්න පෙරුම් පිරුවා
මම සත්තයි...

එහෙත් මා නුඹේ
ගමට ගියේ
අහම්බයෙන් ...
නුඹේ සුවිසල් මැදුරම
සරසා තිබුණි සුදු කොඩියෙන්



සුදු මුහුණ මැලවීලා...
නුඹ අවසන් නින්දේ පසුවෙලා
එතනම මියැදුණි
මගේ හදවත
සිය දහස් වාරයක්...

**සෙ/එල්100140**
**සාසෙ ජයලත් බණ්ඩාර එච්එම්පීඑස්**
**2(සෙව්) ශ්‍රීලයුවෙබ**

## අරුණෝදය

පියකරු උදයේ සුමුදු මල්          පිපෙනවා
කුරුල්ලන් අවදිව මධුර ගී          ගයනවා
තුරුඅතු හරිත පැහැයෙන්          දිලෙනවා
අරුණෝදය සැම සිත්          පුබුදුනවා

හැම හදකම පැතුමන් මල්          පුබුදන්න
කඩිසරව අලස නොවී          ඉන්න
ඔබත් මමත් අප සැම දෙන          එකමුතුව
අපට හැකිය රට දැය          නංවන්න

කිළිටි සිතුවිලි සැමගෙන්          දුරලන්න
ආගමට දහමට ලබැඳීව ජීවත්          වන්න
අපගේ දිවයින මුතු මෙන්          බබලන්න
ක්‍රියාකරමු ඔබ අප සැවොම          එක්ව

**සෙ/19ඊ00492**
**ලා/කෝ ගුණවර්ධන එස්එම්වීකේඒ**
**19 (සෙව්) ශ්‍රීලංසිරෙ.**

# ඒකක විත්ති



## කඳවුරු සංචාරයක



14 සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්ජ් නුගේරා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පසුගියදා කොළඹ කැළණිමුල්ල ප්‍රදේශයේ ස්ථානගත 9 (සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ නිරීක්ෂණ චාරිකාවක නිරත විය.

මෙහිදී ඒකක අණදෙන නිලධාරි මේජර් මේජර් ඒඩී ගුණරත්න ආර්එස්පී විසින් සේනාංකාධිපති පිළිගන්නා ලදී.

## ප්‍රථම ස්ථානය දිනා



ස්වේච්ඡා බළසේනාවේ සේනාවිධායක ගේ උපදෙස් මත ආරක්ෂක සේනා මූලස්ථාන යටතේ ස්ථාන ගත ස්වේච්ඡා ඒකක අතර පැවැති එස් 05 සංකල්පය ක්‍රියාත්මක කිරීමේ තරඟාවලියේ ප්‍රථම ස්ථානය දිනා ගැනීමට 19(සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව සමත් විය. ස්වේච්ඡා ඒකක රැසක් සහභාගී වූ මෙම තරඟාවලියේ දී ජයගත් 19 (සෙව්) ශ්‍රීලංසිරෙ වෙත 55 වන සේනාංකයේ සේනාංකාධිපති නිරීක්ෂණ චාරිකාවක නිරත වූ අයුරු.

## සාමූහික පුහුණුවක අබිමානය





පදවිය බෝගස්වැව ප්‍රදේශයේ ස්ථාන ගත 19(සෙව්) බළඇණිය ගජබා රෙජිමේන්තුව සිය බළඇණි පුහුණුව පසුගියදා 56 වන සේනාංක බළඇණි පුහුණු පාසල වෙතින් සාර්ථකව හදාරන ලදී. නිලධාරි 12 ක් හා සෙසුනිලයින් 301 ක් සහභාගිවූ මෙම පාඨමාලාවේ අවසන් දේශනය 563 බළසේනාවේ බළසේනාධිපති කර්නල් ඩීපීයූ ගුණසේකර ආර්එස්පී යූඑස්පී අයිජී විසින් සිදුකරන ලදී. පාඨමාලාවේ දක්ෂතම ශිෂ්‍යාට හිමි කුසලානය හිමිකර ගන්නා ලද්දේ නි/8548 කපිතන් එන්ජීඑන් සඳකැළුම් විසිනි.

# කෙළිබිම ජයගෙන





ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු අන්තර් බළඇණි මළල ක්‍රීඩා තරඟාවලිය මෙවරත් අති උත්කර්ෂවත් අන්දමින් පසුගිය මැයි මස 23, 24, 25 යන තෙදින තුළ අති උත්කර්ෂවත් අන්දමින් අනුරාධපුර මහජන ක්‍රීඩාංගනයේදී පැවැත්විණ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඒපී ද ඉසෙඩ් වික්‍රමරත්න ආර්ඩබ්ලිව්පී එන්ඩීයූ පිඑස්සී සහභාගී විය.

මෙම තරඟාවලියේ ශූරතාවය 5 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව දිනා ගන්නා ලද අතර, දෙවන ස්ථානය 20 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව ද තෙවන ස්ථානය 4 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව විසින් ද දිනා ගන්නා ලදී.



ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළු රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඒපී ද ඉසෙඩ් වික්‍රමරත්න ආර්ඩබ්පී එන්ඩීයූ පීඑස්සී ගේ මගපෙන්වීම මත 2017 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු වර්ණ ප්‍රදානෝත්සවය පසුගිය ජුනි මස 29 සහ 30 යන දෙදින තුළ කුරුණෑගල, වයඹ පලාත් සභා ශ්‍රවණාගාරයේදී අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණ.

1991 වසරේ සිට 2016 වසර දක්වා විවිධ ඉසව් ඔස්සේ කෙළිබිම දිග්විජය කල ක්‍රීඩකයින් 295 දෙනෙකු හා ශ්‍රී ලාංකේය නාමය මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදා නාමයද ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළු නාමය ද ජාත්‍යන්තර තලය දක්වා ඔසවා තැබූ විශිෂ්ඨයින් 17 දෙනෙකු වෙනුවෙන් ද එදින වර්ණ හිමිගන්වන ලදී.

උත්සවයේ ප්‍රධාන ආරාධිතයා වශයෙන් ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු රෙජිමේන්තු අධිපති සහභාගී වූ අතර, මෙම අවස්ථාවට එම මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුළු ජ්‍යෙෂ්ට නිලධාරිහු රැසක්ද, විශ්‍රාමික ජ්‍යෙෂ්ට නිලධාරිහු රැසක්ද, ක්‍රීඩකයින් ඇතුළු විශාල පිරිසක් ද එක්වූහ.




ආරක්ෂක සේනා මුලස්ථාන කිළිනොච්චි ආඥාපති මේජර් ජෙනරාල් ඒ කාරියකරවන යූඑස්පී එන්ඩීසී ගේ සංකල්පයකට අනුව එම සේනාංක බළ ප්‍රදේශයේ ස්ථාපිත ඒකක අතුරින් ශක්තිවන්තම බළඇණිය තේරීමේ තරඟයක් පසුගියදා කිළිනොච්චි පරවිපංජාන් මහජන ක්‍රීඩාංගනයේදී පැවැත්විණ. එහි තෙවන ස්ථානය හිමිකර ගැනීමට 17 (සෙව්) ගජබා රෙජිමේන්තුව සමත් විය.

මෙම තරඟය සඳහා නිත්‍ය හා ස්වේච්ඡා ඒකක 34 ක් සහභාගී වූ අතර, ආසේමු (කිළි) ප්‍රදේශයේ ස්ථාපිත ස්වේච්ඡා ඒකක අතුරින් ජයග්‍රහණයක් හිමිකර ගත් එකම ස්වේච්ඡා බළඇණිය මෙය වීමද විශේෂත්වයකි.



ශ්‍රී ලංකා යුද හමුදා කාලතුවක්කු රෙජිමේන්තු අන්තර් ඒකක අත්පන්දු තරඟාවලියේ අවසන් මහා තරඟය 2017 ජුලි මස 16 වන මින්නේරිය කාළතුවක්කු හමුදා අත්පන්දු ක්‍රීඩා පිටියේදී පැවැත්විණ. මෙහිදි සහභාගී වූ සියලුම කාළතුවක්කු හමුදා රෙජිමේන්තු කණ්ඩායම් පරාජය කරමින් 12 (සෙව්) ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා කණ්ඩායම ශූරතාවය දිනා ගැනීමට සමත් වූහ.

# කෙළිබිම
# ජයගෙන








ශ්‍රී ලංකා යුද හමුදා කාලතුවක්කු රෙජිමේන්තු අන්තර් ඒකක ආධුනික අත්පන්දු තරගාවලිය 2017.07.03 දින සිට 2017.07. 07 දින දක්වා මින්නේරිය කාළතුවක්කු හමුදා අත්පන්දු ක්‍රීඩා පිටියේදී පැවැත්විණ. කාළතුවක්කු රෙජිමේන්තු කණ්ඩායම් 11ක් තරග වැදුණු මෙම තරගාවලියේදි අවසන් මහා තරගය සඳහා සුසුසුකම් ලැබු 7 වන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා කණ්ඩායම පරාජය කරමින් විශිෂ්ඨ ජයක් වාර්තා කිරීමට 5 (සෙව්) ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා කණ්ඩායම සමත් වුහ. ජයග්‍රාහී කණ්ඩායම් සඳහා තිළිණ ප්‍රදානෝත්සවය 2017.07.16 වන දින කාළතුවක්කු අත්පන්දු ක්‍රීඩා පිටියේදී කාලතුවක්කු රෙජිමේන්තු කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් පීඩබ්ලිව්බී ජයසුන්දර යූඑස්පී එන්ඩීසී පීඑස්සී අයිජී ගේ ප්‍රධානත්වයෙන් පැවත්වූ අතර, මෙම අවස්ථාවට කාලතුවක්කු හමුදාවේ ජ්‍යෙෂ්ට නිලධාරිහු රැසක්ද එක්වුහ. තරගාවලියේ දක්‍ෂතම පන්දු ඔසවන්නා, දක්‍ෂතම පිටිය රකින්නා, දක්‍ෂතම පන්දු යවන්නා හා තරගාවලියේ දක්‍ෂතම ක්‍රීඩකයා යන සම්මානයන් සඳහා හිමිකම් කීමට ද 5 (සෙව්) ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා ආධුනික අත්පන්දු කණ්ඩායම සමත් වීම විශේෂත්වයකි.

# සැබෑ වූ සිහිනයේ
# සුන්දර මතකය





පසුගියදා යුගදිවි ගමන් ඇරඹූ
10(සෙව්) විජයබා
රෙජිමේන්තුවට අයත්
සෙ/10එච්01781
**සාසෙ චන්ද්‍රසිරි එස්එච්අයිපී**
හා
**ඒ. එල්. ජනංජනා දිශානි**
**මෙනවිය...**



පසුගියදා යුගදිවි ගමන් ඇරඹූ
17(සෙව්) ගජබා
රෙජිමේන්තුවට අයත්
සෙ/101119
**ලා/කෝ සඳරුවන්**
**ඩීඑම්එම්ආර්**
හා
**ඩබ්ලිව්ජී චතුරංගනි මෙනවිය...**



පසුගියදා යුගදිවි ගමන් ඇරඹූ
2(සෙව්) ශ්‍රී ලංකා යුද හමුදා
වෛද්‍ය බළකායට අයත්
සෙ/එල්100034
**සාසෙ ලක්දිනී එස්ඩී**
හා
**ඩී. දිනේෂ් සම්පත් කුමාර**
**මහතා**

# ඒකක
# විත්ති



## නව කාර්යාල සංකීර්ණය විවෘත කරමින්





ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළු රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඒපී ද ඉසෙඩ් වික්‍රමරත්න ආර්ඩබ්පී එන්ඩීයූ පීඑස්සී පසුගිය 2017 අප්‍රේල් මස 30 වන දින කුරුණෑගල වාරියපොල ප්‍රදේශයේ ස්ථානගතව ඇති 1 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ කඳවුරු සංචාරයක නිරත විය. 1 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළු අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ඩීඑම්සීකේ දිසානායක ශ්‍රීලංජාආබමුගේ ආරාධනයෙන් එදින රෙජිමේන්තු අධිපති විසින් එම ඒකකයේ පරිපාලන කටයුතු වඩාත් කර්යක්ෂම කිරීමේ අරමුණින් ඉදිකරන ලද, නව දෙමහල් කාර්යාල සංකීර්ණය හා ව්‍යායාම මධ්‍යස්ථානය ද විවෘත කරන ලදී.

## සෙබළුන් ගේ පහසුව තකා



24 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු සාමාජිකයින්ගේ සුභසාධනය උදෙසා ඉදිකරන ලද ජන අවන්හලක්, තේ පැන්හලක් හා කරණවෑම් හලක් එම ඒකක අණදෙන නිලධාරි මේජර් එම්ඡ්සීපී මාරසිංහ ශ්‍රීලංජාආබමු ගේ සුරතින් පසුගියදා විවෘත කෙරිණ.

## කඳවුරු සංචාරයක



ආරක්ෂක සේනා මුලස්ථානය (නැගෙනහිර) නව ආඥාපති වශයෙන් රාජකාරි භාරගත් මේජර් ජෙනරාල් නන්දන සේනාධීර ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යුඑස්පී එන්ඩීයූ පසුගියදා එහි සේනාංක මුලස්ථාන, බළසේනා මුලස්ථාන හා ඒකකයන්හි සංචාරයක නිරත විය. එහිදි ආරක්ෂක සේනා ආඥාපති විසින් භට පිරිස් ඇමතීම ද සිදුකරන ලදී.

## කඳවුරු සංචාරයක





ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඒපී ද ඉසෙඩ් වික්‍රමරත්න ආර්ඩබ්ලිව්පී එන්ඩීයූ පීඑස්සී 2017.05.26 වන දින 17 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ කඳවුරු සංචාරයක නිරත විය. එහිදි රෙජිමේන්තු අධිපති වෙත කඳවුරු සම්මාන මුරයක් පිරිනැමු අතර, බළලත් නිලධාරි හා සැරයන් නිවස්නයේ නවතමයෙන් ඉදිකරන ලද ගොඩනැගිල්ල විවෘත කිරීමද එදින රෙජිමේන්තු අධිපති විසින් සිදුකරන ලදී.

# හෙළ සිරිතයි අවුරුද්දයි





ජාතික හා ආගමික සහජීවනය නංවාලීමේ අරමුණ ඇතිව සිංහල හින්දු අළුත් අවුරුදු සැණකෙළියක් මඩකලපුව කලෙයිවාන් පැරණි පාසල් ක්‍රීඩාංගනයේදී පසුගිය අප්‍රේල් මස පැවැත්විණ. ජන ක්‍රීඩාවලට මුල්තැන දෙමින් 11 (සෙව්) සිංහ රෙජිමේන්තුව හා මඩකලපුව කුරුක්කල්මඩම් ඒෂියන් යූත් ක්‍රීඩා සමාජය විසින් එක්ව සංවිධානය කරන ලද මෙම අවුරුදු උත්සවය සඳහා ප්‍රදේශයේ සර්ව ආගමික නායකයින්, ප්‍රාදේශිය ලේකම්වරු ඇතුළු ප්‍රභූන් රැසක්ද, 231 බළසේනාවේ සිවිල් සම්බන්ධීකරණ නිලධාරි ලුතිතන් කර්නල් එම්ආර්ඩීජී විජේසේකර ඇතුළු යුද හමුදා සාමාජිකයෝ විශාල පිරිසක් ද එක්වූහ. බක්මහ සැණකෙළිය අවසානයේ සංගීත ප්‍රසංගයක්ද පැවැත්විණ.







උදාවූ 2017 සිංහල හින්දු අළුත් අවුරුදු උදාව සැමරීම වස් 20 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව විසින් සංවිධානය කරන ලද බක්මහ උළෙලක් පේදුරුතුඩුවේ කට්කෝලම් ක්‍රීඩාංගණයේදී 55 සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් එම්ජීඑස්කේ මුහන්දිරම් ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. එම බක්මහ උළලේදී කණාමුට්ටිය බිඳීම, ඉඳිකටුවට නූල ඇමිණීම, විකට ඇඳුම් තරගය, කඹ ඇදීම ආදි සම්ප්‍රදායික තරඟ රාශියක් ද පැවත්විණ. ඒ අතුරින් හින්දු සම්ප්‍රදායන්ට අයත් තරඟ ඉසව් රාශියක්ද සංවිධානය කොට තිබීම විශේෂත්වයකි. මෙම අවස්ථාවට 551 බළසේනාවේ බළසේනාධිපති කර්නල් එස් ඩබ්ලිව්එම් ප්‍රනාන්දු ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ඇතුළු යුද හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරිහු රැසක්ද, ප්‍රදේශයේ ආගමික පූජකවරු, සිවිල් ආයතන රැසක ප්‍රධානින් ඇතුලු ප්‍රදේශයේ විශාල පිරිසක් ද සහභාගී වූහ.

ගෙවීගිය සිංහල හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් 24 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව හා 15 ශ්‍රී ලංකා පාබල හමුද රෙජිමේන්තුව එක්ව සංවිධානය කරන ලද බක්මහ උළෙලක් එම ඒකක ස්ථාපිත දෙහිවත්ත ප්‍රදේශයේදී පසුගියදා අති උත්කර්ෂවත් අන්දමන් පවත්වන ලදි. 224 බළසේනාවේ බළසේනාධිපති කර්නල් ඩබ්ලිව්ආර්එම්එම් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ උපදෙස් මත සංවිධානය කෙරුණු එම බක්මහ උළෙල සඳහා ප්‍රදේශයේ සිවිල් ජනතාව විශාල පිරිසක් එක්වූහ.

# විවිධ පුවත්





9 (සෙව්) ශ්‍රීලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරි මේජර් ඒඩී ගුණරත්න ගේ සංකල්පයකට අනුව පැවැත්වූ 2016 වසරේ දක්ෂතම ලිපිකරුවා හා සිවිල් සේවකයා තේරීමේ තරගයක් ඉකුත්දා පැවැත්විණි. එම ඒකකයේ ලිපිකරුවන්ගේ හා සිවිල් සේවක මහතුන්ගේ වෘත්තිය නිපුණතාවය ඉහළ නැංවීමටත් එමඟින් කාර්යක්ෂමතාවය වැඩිකර පලදායි සේවාවක් ලබා ගැනීමත්, ඔවුන්ගේ සේවය අගය කිරීමත් එකී තරඟාවලියේ අරමුණ විය. එහිදි වසරේ විශිෂ්ටතම ලිපිකරු ලෙස සෙ/9ඩී01272 කෝප්‍රල් පතිරණගේ එම්එන් ද වසරේ ද විශිෂ්ටතම සිවිල් සේවකයා ලෙස එච්එම්එල්ඩී හේරත් යන අය ද සම්මාන ලැබූහ.

# සුභ මොහොතින්
# නව තනතුරු ලැබ



5 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු
වැ.බ. අණදෙන නිලධාරි
මේජර් **එල්ආර්ටීබීපී බංඩාර**
ශ්‍රීලංජාආබමු.



5 වන (සේවි) බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදා
රෙජිමේන්තු සැරයන් මේජර්
බලළත් නිලධාරි ‌|
**ඊජීඑන් දසනායක**



14 (සේවි) ගැමුණු හේවා බළඇණියේ
රෙජිමේන්තු සැරයන් මේජර්
බලළත් නිලධාරි ‌|
**එස්ඒඩී ප්‍රසන්න**



1 ශ්‍රී ලංකා යුද හමුදා පුරෝගාමී බලකා
රෙජිමේන්තු සැරයන් මේජර්
බළළත් නිලධාරි ‌|
**ආර්ඒ ප්‍රේමසිරි ගාමිණි**



21 (සේවි) ගැමුණු හේවා බළඇණියේ
රෙජිමේන්තු සැරයන් මේජර්
බලළත් නිලධාරි ‌|
**කේසීවී මෙන්ඩිස්**

# විවිධ
# පුවත්





ආරක්ෂක සේනා මූලස්ථානය නැගෙනහිර ආඥාපතිගේ සංකල්පයකට අනුව 22 සේනාංක බළප්‍රදේශයේ ස්ථානගත බළසේනා හා ඒකක අතර පැවැති නව නිපැයුම් තරඟාවලියේ දෙවන ස්ථානය හිමිකර ගැනීමට 24 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව සමත් විය. ඒ එකවර ගඩොල් 20 කැපිය හැකිවන සේ නිර්මාණය කරණ ලද ගඩොල් කැපීමේ යන්ත්‍රය සඳහාය.

24 ශ්‍රීලංජාආබමු අණදෙන නිලධාරී මේජර් එම්ඒසීපී මාරසිංහ ශ්‍රීලංජාආබමු ගේ මාර්ගෝපදේශකත්වය යටතේ සෙ/24කියු00299 ලා/කෝ හේමන්ත ඒඒඒකේ, සෙ/කියු101978 සාසෙ තුෂාර පීටීඑන් හා සෙ/කියු104882 සාසෙ සඳරුවන් බීඒඩබ්ලිව් යන සෙනීන් විසින් මෙම නිර්මාණය සිදුකළ අතර, ඔවුන් විසින් විදුලි බලයෙන් ක්‍රියාකරන වැලි හලන යන්ත්‍රයක්ද එදින ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කරන ලදි.

# විවිධ පුවත්



## දිළිඳු දනට අත දෙමින්...



කිළිනොච්චිය, භරතිපුරම් ප්‍රදේශයේ ස්ථානගත 17 (සෙව්) ගජබා රෙජිමේන්තුව විසින් ආසේමු (කිළි) ආඥාපති ගේ සංකල්පයකට අනුව කිළිනොච්චි ප්‍රදේශයේ ජීවත්වන දිළිඳු පවුල් 21ක් සඳහා කිරි ගවයින් බෙදාදීමේ මහගු මෙහෙවරක් පසුගියදා සිදුකරන ලදී. ප්‍රදේශයේ තෝරාගත් දිළිඳු පවුල්වල ජීවන තත්ත්වය නංවාලීමේ මූලික අරමුණ කරගනිමින් මෙම කිරි ගවයින් බෙදාදීමේ උත්සවය කිළිනොච්චි ලුම්බිණි විහාර භූමියේදී සිදුකෙරිණ.

## මනුෂ්‍යත්වයෙන් පෙරට ...



12(සෙව්) විපාරෙ ඒකකයට අයත් සෙ/12එච්00118 සැරයන් විජේරත්න ඩබ්ලිව්එම් යන ජෝයකොනොනි රාජකාරි කටයුත්තක් සඳහා 52 සේනාංකය වෙත ගොස් නැවත ඒකකය වෙත පැමිණෙමින් සිටියදි සිවිල් වැසියෙකුට අයත් රුඃ 35000.00 ක් පමණ වටිනා සැම්සුන් වර්ගයේ ජංගම දුරකථනයක් හමුව ඇත. ඔහු එය තමා සන්තකයේ තබාගැනිමට හැකියාව තිබීයදී එසේ නොකර ඒකක අණදෙන නිළධාරි වෙත දැනුම්දීමෙන් පසු එය හිමිකරු සොයා භාරදීමට ක්‍රියාකරන ලදී. ඔහුගේ එම සත්ක්‍රියාව එම ඒකකයේත් විජබාහු පාබල රෙජිමේන්තුවේත් සමස්ථ යුද හමුදාවේත් ගෞරවයට හේතු වන්නකි. එසේම එය ජාතින් අතර සංහිඳියාව වර්ධනය කිරීමට ද මහගු රුකුලකි.

## නව සළාක ගබඩාවක්...



අම්පාර තිරුක්කෝවිල් ප්‍රදේශයේ ස්ථානගත 12 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවෙහි අභිනවයෙන් ඉදිකරන ලද සළාක ගබඩාව හා මුළුතැන්ගෙයක් පසුගියදා එහි වැ.බ. අණදෙන නිලධාරි මේජර් ජීඒඩීපී ගනෙහිආරච්චි විසින් විවෘත කරන ලදී. අණදෙන නිලධාරිගේ අධීක්ෂණය මත ඒකක සෙනින්ගේ ශ්‍රමයෙන් ඉදිවූ එමගින් ඒකකයේ එතෙක් පැවැති විශාල අඩුපාඩුවක් සම්පූර්ණ විය.

## රට රැකුමට පෙරට යමින්...






දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශයේ ස්ථාපිත 3(සෙව්) කාන්තා බළකා පුහුණු පාසල වෙතින් පුහුණුව ලැබූ තවත් ආධුනික කාන්තා සෙබළියන් පිරිසක් පසුගිය දා විසිර යන ලදී. මෙම විසිරයෑමේ පෙළපාලියේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා මූලස්ථාන (නැගෙනහිර) ජ්‍යෙෂ්ඨ කර්නල් සම්බන්ධීකරණ නිළධාරී කර්නල් එම්පීපී පෙරේරා සහභාගී විය.

# කපිතාන් අලදෙනිය
# හැබැහින් දකිමු...






කපිතාන් සාලිය අලදෙනිය

**"1990 ජූලි 11 කොකාවිල් ප්‍රහාරය වුකලී පසුගිය තිස් වසරක යුද ඉතිහාසය තුළ සිදුවූ බිහිසුණුම හා සංවේදීම සිදුවීමකි. එම අවසන් ප්‍රහාරය වන විට කොකාවිල් හි පිහිටි රූපවාහිනී සම්ප්‍රේෂණ මධ්‍යස්ථානයෙහි ආරක්ෂාව පිණිස හමුදා භටයින් 59 දෙනෙකු හා සිවිල් සේවකයින් 05 දෙනෙකු සේවයේ නිරත වූහ. ඒ අතුරින් හමුදා භටයින් 57 දෙනෙකු හා සිවිල් සේවකයින් 04 දෙනෙකු ත්‍රස්තවාදී ප්‍රහාර හමුවේ තම ජීවිත පුජා කළ අතර හමුදා සාමාජිකයින් දෙදෙනෙකු හා එක් සිවිල් සේවකයෙකු දිවි බේරාගැනීමට සමත්වුහ. ප්‍රමාණවත් තරම් ආහාරපාන හෝ පතුරොම් පවා නොමැතිව පුරා දින 22 ක් සතුරාට යටත් නොවුණු ඔවුන් කඳවුර අතහැර උපක්‍රමශිලීව පසුබැසීමට උපදෙස් ලැබී තිබියදීත් තුවාල ලත් තම සගයින් දමා යා නොහැකි බැවින් මියෙනතුරුම සටන් වැද තම ජීවිත රට වෙනුවෙන් පුද කළේය. ඉහත ක්‍රියාදාමයට නායකත්වය ලබාදුන් 2/ලුතිතන් සාලිය අලදෙනිය රණවිරුවෙකුට පිරිනමන ඉහලම සම්මානය වන පරම වීර විභූෂණයෙන් පවා පිදුම් ලැබුවේය. ඉතිහාසයේ ප්‍රථම වතාවට එම සම්මාණයෙන් පිදුම් ලැබු යුද හමුදා නිළධාරියා වන්නේද ඔහුය."**

නමුත් අවාසනාවකට එවන් අභීත රණවිරුවෙකු පිළිබඳ මතකය වත්මන් සමාජය වෙතින් දුරස් වෙමින් පවතී. එබැවින් මව්බිම වෙනුවෙන් තම දිවි දෙවෙනි කොට කැපවූ එකී අලදෙනිය ඇතුලු වීරෝධාර රණවිරුවන් පිළිබඳ මතකය මතු පරපුරට දායාද කරලීම යුතුකමක් සේම ජාතික වගකීමක් ලෙස සැලකිය හැකිය. එකී අරමුණ පෙරදැරිව ස්වේච්ඡා බළසේනා මූලස්ථානයෙහි සේවයේ නිරත **මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ** විසින් කොකාවිල් ප්‍රහාරය හා කපිතාන් අලදෙනියගේ චරිතාපදානය අලලා පර්යේෂණාත්මක ග්‍රන්ථයක් රචනා කිරීමට කටයුතු යොදා ඇත. මෙහි පළවනුයේ අදල කෘතිය පිළිබඳ කතුවරයා සමග කළ සාකච්ඡාවකි.

**ප්‍රශ්නය : මෙවැනි කෘතියක් ලියන්නට ඔබව පෙළඹවූ හේතුව කුමක්ද ?**

කපිතාන් අලදෙනිය ස්වේච්ඡා බළසේනාවේ රණකාමී ඉතිහාසය තුළ සංකේතයක් බඳුයි. රණවිරුවෙකුට ලැබෙන ඉහලම සම්මානය වන පරම වීර විභූෂණ පදක්කමෙන් පිදුම් ලැබූ ත්‍රිවිධ හමුදා සාමාජිකයින් 29 දෙනෙක් ඉන්නව. ඒ අතරින් ඉතිහාසයේ ප්‍රථම වතාවට එම පදක්කම හිමිකර ගත් නිලධාරියා කපිතන් සාලිය අලදෙනියයි. ඒ වගේම එම සම්මාන වලට පාදක වුණු සිදුවීම් සලකා බැලුවොත් වඩාත්ම සංවේදී කථා පුවත කොකාවිල් සිදුවීම බවයි මගේ හැඟීම. නමුත් අවාසනාවකට අලිමංකඩ සටනේ වීරයෙකු වුණු හසලක ගාමිණී තරමට සිවිල් සමාජය තුළ අලදෙනිය ගැන කියවෙන්නේ නැහැ. විශේෂයෙන්ම යුද හමුදාව තුළ පවා කපිතන් සාලිය අලදෙනිය කව්ද කියල නොදන්න අය බොහෝ ඉන්නව. අන්න ඒ නිසා මම හිතුව මේ සැඟ වුණු ඓතිහාසික කථාන්දරය ඉස්මතු කළ යුතුයි කියල. ඒ වගේම කොකාවිල් ප්‍රහාරය නමින් අදාලත්වයක් නැති සහ වැරදි තොරතුරු සමාජගත වෙමින් තිබෙනවා. රණබිමේ නිර්මාණකරුවෙකු හැටියට එය නිවැරදි කිරීම වගකීමක් විදිහටයි මම දකින්නේ. ඒ වගේම මගේ නිර්මාණ රසවිඳින පාඨකයින් වැඩි පිරිසක් කලක පටන් මෙවැනි කෘතියක් රචනා කරන ලෙස ඉල්ලීමක් කර තිබුණා. ඒ කොහොම උනත් පසුගිය අවුරුදු දෙකකට ආසන්න කාළයක් මම මේ පිළිබඳ ගවේෂණය කලා. මේ පොත එහි ප්‍රථිඵලයක්.

**ප්‍රශ්නය : ඔබ මේ ගවේශණය සිදුකලේ කොහොමද.?**

මුලින්ම මම මේ සිදුවීමට සම්බන්ධ පුද්ගලයො කව්ද කියන එක හොයල බැලුවා. දැනට මේ සිද්ධියට වසර 27 ගතවෙලා. ඒ නිසා තොතුරු හොයාග න්න එක ලේසිවුනේ නැහැ. සමහර පුද්ගලයො ගැන හරි තොරතුරු එම ඒකක වල හෝ රෙජිමේන්තුවලවත් නැහැ. ඒ වගේම සිදුවීමට සම්බන්ධ වුන වැඩි දෙනෙක් විශ්‍රාමිකයි. කිහිප දෙනෙක් පිටරටවල. ඇතැම් අය ජීවතුන් අතරත් නැහැ. සමහරු ගොඩක් වයසයි. ඒ වගේම ලංකාවේ විවිධ ප්‍රදේශවලයි ඔවුන් ජීවත් වෙන්නෙ. කොහොම හරි දුෂ්කර ව්‍යායාමයකින් පස්සෙ මේ සිදුවීමට සෘජුව හා වක්‍රව සම්බන්ධවුණු පුද්ගලයො 50 දෙනෙකුගේ පමණ තොරතුරු හොයාග න්න මට පුලුවන් වුණා.

ඒ හැම කෙනෙක්ම මම පුද්ගලිකව හමුවුනා. ඒ වෙනුවෙන් කෑගල්ල, කඩුගන්නාව, මහනුවර, නුවරඑළිය, වත්තල, ජාඇල, අනුරාධපුරය, මැදවච්චිය, මාතර, ගාල්ල, කොළඹ වගේ තව ගොඩක් තැන්වල ගියා. විශේෂයෙන්ම මාන්කුලම් හා කොකාවිල් වලට දෙතුන් වතාවක්ම යන්න සිදුවුනා.

**ප්‍රශ්නය : ඒ ඇරුනාම වෙන සොයාගත් තොරතුරු මොනවද? ඒ වගේම ඒ තොරතුරු වල සත්‍යතාවය පිළිබඳ ඔබ පාඨකයාට ලබාදෙන සහතිකය කුමක්ද?**

මෙහිදී 1990 කාලවකවානුවෙ පලවුණු පුවත්පත් රූපවාහිනී හා ගුවන්විදුලි වාර්ථා පිළිබඳවත් මම අවධානය යොමුකලා. ඒවා බොහොමයක් මා සතුයි. එවකට රූපවාහිනී සංස්ථාවේ හා පිදුරුතලාගල රූපවාහිනී සම්ප්‍රේෂණාගාරයේ සේවය කළ නිළධාරින් පවා මට හමුවෙන්න අවස්ථාව ලැබුනා. තවත් විශේෂයක් තමයි මෙම සිදුවීමට සම්බන්ධ වසර 27 ක් පැරණි අතිශය දුර්ලබ ඡායාරූප එකතුවකුත් මා ලග තිබෙනව. ඒවා බොහොමයක් මේ පොතේ පලකරන්න කටයුතු යොදනව. හැම තොරතුරකටම අදාල වාචික හා ලිඛිත සාක්ෂි තිබෙනව. ඒ නිසා ඉතාම සත්‍ය හා විශ්වාසනීය තොරතුරු මතයි මේ කතාව ලියැවෙමින් තිබෙන්නෙ.

**ප්‍රශ්නය : පොතේ අන්තර්ගතය ගැන යමක් සඳහන් කළොත් ?**

3(සේවි) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු හට පිරිස් කොකාවිල් කඳවුර බාරගන්නෙ

මීළග පිටුවට...



2/ලුතිතන් සාලිය අලදෙනිය සිය පුහුණු පාඨමාලාව අවසානයේ විසිරයාමේ පෙළපාලියේදී අසිපත ලබා ගනිමින්.



උතුර දකුණ යා කරන ලද කොකාවිල් සම්ප්‍රේෂණ කුළුණ 1982 ජපන් ආධාර මත එහි ඉදිකරනු ලැබීය- ත්‍රස්ථවාදීන් විසින් 1990 ජුනි 11 වන දින ප්‍රහාර එල්ල කර එය විනාශ කිරීමෙන් අනතුරුව අදවන විට එහි ඉතිරි වී ඇති සම්ප්‍රේෂණ කුළුණු පාදස්ථම්භය- (වත්මන් කොකාවිල් කඳවුරු මධ්‍යයේ මෙය දැකගත හැකිය-)

1990 මැයි 19 වන දිනයි. එතැන් පටන් 1990 ජූලි 11 එම කඳවුරට එල්ල වූ අවසන් ප්‍රහාරය තෙක් වූ සිදුවීම් මාලාව මේ පොතේ අන්තර්ගතයි. ඒ වගේම මාන්කුලම් කඳවුරට අදාළ පරිච්ඡේදයකුත් මෙහි ලියවෙනවා. ඊට හේතුව මාන්කුලම් කඳවුර ඒ දවස්වල පාලනය වෙන්නෙත් 3 (සෙව්) සිංහ හය පිරිස් අතින්, මේ කඳවුරු දෙකම අවස්ථා දෙකකදි ත්‍රස්ත ප්‍රහාර වලට ලක් වෙනවා. එම සිදුවීම් පෙළ විශ්ලේෂණය කිරීමේදි කපිතාන් අලදෙනිය වගේම තවත් විරුවන් රැසක් අප්‍රකටව සිදුකල වීර ක්‍රියාවන් පිළිබඳ විස්තර හෙළිවෙනවා. ඒ සෑම පුද්ගලයෙක් ගැනම සත්‍ය තොරතුරු මෙහි ඇතුලත්.

**ප්‍රශ්නය : රණබිමේ සාහිත්‍යයක් බිහිකිරීම කාලීන අවශ්‍යතාවයක් ලෙස ඔබ දකින්නේද ?**

සත්තකින්ම ඔව්. ලොව දරුණුම ත්‍රස්තවාදය පරාජය කළ විශිෂ්ඨතම හමුදාව අප සතුයි. තිස් වසරක් පුරා පැවැති ත්‍රස්තවාදය හමුවේ අපලත් අත්දැකීම් සම්භාරය අපමණයි. නමුත් මේ වන විට වසර 09 කට වැඩි සේවා කාලයක් සහිත අයවලුන් මතු දිනෙක හමුදා සේවයෙන් ඉවත් වූ දවසට පසුගිය යුධ අත්දැකීම් ලත් කිසිවෙකු අප හමුදාවල ඉතිරි වන්නේ නෑ. ඒ නිසා ඒ අත්දැකීම් දැන් දැන්ම මතු පරපුර වෙනුවෙන් ලියා තැබීමේ ඓතිහාසික අවශ්‍යතාවයක් මම දකිනවා. අප දිනාගත් සාමය හා නිදහස බන්දේසියක තබා ලබාගත් දෙයක් නොවන බව මතු පරපුර දැනගත යුතුයි. මේසා විශාල ජීවිත සංඛ්‍යාවක් කැපකරන ලද්දේ ඒ වෙනුවෙන් බව ඔවුනට මතක් කර දිය යුතුයි. වසර දහස් ගණනක සිටම අපේ රජදරුවෝ කළ කීදැ පැරණි නටඹුන් මගින් ශිලා ලේඛණ තුළින් අදටත් අපට දැකගන්න දැනගන්න පුලුවන්. නමුත් මෑත ඉතිහාසයේ ත්‍රස්තවාදයට එරෙහිව ඉටුකළ මෙහෙවර පිළිබඳ දැනගන්න එහෙම සාක්ෂි සාධක නැහැ. ඒ නිසා ඒවා මේ අයුරින් ලියා තැබීම යුගයේ අනිවාර්ය අවශ්‍යතාවයක් ලෙස දකිනවා. නමුත් මේ කිසිවකින් වෛරය වැපිරීමක් හෝ යුද්ධයේ කුරිරු ම්ලේච්ඡ බව ඉස්මතු කිරීමක් නොකරන්නට අප වගබලා ගත යුතුයි. අවශ්‍යවන්නේ රණවිරුවන්ගේ උතුම් මෙහෙවර අගය කිරීම පමණයි.



**ප්‍රශ්නය : කුමන කාලවකවානුවේද මේ පොත එළිදක්වන්න බලාපොරොත්තු වෙන්නෙ?**

කලින් සැලසුම් කල දින වකවානු නම් දැන් පහුවුනා. කොහොම නමුත් ඉතාම ඉක්මනින් එළිදක්වනව. පොත ලියාගෙන යද්දි නොහිතපු තරමේ තොරතුරු එකතු වෙන්න පටන් ගත්ත. ඒ හැම තොරතුරක්ම ඉතාම වැදගත් ඒ වගේම රසවත්. ඒ නිසා ඒවා එක්වත් මගහරින්න පුලුවන් කමක් නැහැ. පරිපූර්ණ කතාවක් සමාජයට දිය යුතුයි වගේම ඒ වීරෝධාර රණවිරු කැළට සාධාරණ ඇගයුමක් ලබා දෙන්නත් ඕනෙ. ඒ නිසා තරමක් ප්‍රමාද වෙලා හරි උසස් කෘතියක් එළිදක්වන්න පුලුවන් වෙයි කියලා මම විශ්වාස කරනව. යුද හමුදා මූලස්ථානයේ අනුමැතිය ඇතිව එළඹෙන සාහිත්‍ය මාසයෙදී හෝ ඊට ආසන්නව මේ පොත දොරට වඩන්න මට හැකි සෑම උත්සාහයක්ම ගන්නව.

**ප්‍රශ්නය : මේ කටයුතු වලට ඔබට සහාය ලබාදෙන අයවලුන් පිළිබඳ සඳහන් කළොත් ?**

වත්මන් සේනාවිධායකතුමා ඇතුළු ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ හැමෝගෙම සහාය මේ සඳහා ලැබෙනව. විශේෂයෙන්ම නියෝජ්‍ය සේනාවිධායක. මූලික මාණ්ඩලික නිළධාරි, පුහුණු පරීක්ෂක ඇතුළු ජ්‍යෙෂ්ඨ නිළධාරින්ගේ නොමඳ සහායක් ලැබෙනව. ඒ වගේම නිත්‍ය හා ස්වේච්ඡා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රාශියක් මේ සඳහා තොරතුරු ලබා දී තිබෙනවා.

ඒ වගේම හිටපු යුද හමුදාපති තුමාවත් එක් අවස්ථාවකදී මේ සබැදිව දැනුවත් කිරිමේ අවස්ථාවක් මට ලැබුන. එතුමන් මා දිරිමත් කලා මේ කටයුත්ත වෙනුවෙන්. විශේෂයෙන්ම වත්මන් යුද හමුදා මාණ්ඩලික ප්‍රධානි තුමා එවක කිලිනොච්චි ආඥාපති ලෙස සිටි අවධියේ පටන්ම මේ සඳහා මට විශාල ශක්තියක් ලබා දෙනව.

**සාකච්ඡා සටහන :**
**ලුතිතන් කර්නල් ටීආර් ප්‍රමාර්**
**ශ්‍රීලංජාආබමු**

## “ෆන් එකට සෙට් වෙන්න”

# මේ අයත් එකතු කර ගන්න...




නේකවිධ සන්නිවේදන මාධ්‍යයන් අතරින් එදා පටන්ම ගුවන් විදුලියට හිමිව තිබූ තැන අදටද එලෙසම වලංගුව පවතියි. බොහෝ විට රූපවාහිණිය යම් තරමකට ඒ හා තරඟයකට එක්ව තිබුණද හද්ද පිටිසර ගම් නියම්ගම් සිසාරා තවමත් ගුවන් විදුලිය මුල් තැනට පැමිණ ඇත. අන්තර්ජාලය හෝ වෙනත් දියුණු සන්නිවේදන ක්‍රම එතරම් ව්‍යාප්තව නොමැති අප රටෙහි ගුවන් විදුලිය හරහා හැකි පමණ ඒ සියළු හිඩැස පුරවා ඇත. සරලව කියතොත් තම නිවසේ ගුවන් විදුලි යන්ත්‍රයක් නොමැති වුවද අඩුතරමින් මග තොටේදී හෝ ඊට සවන්දීමේ හැකියාව වැඩි දෙනෙකුට ලැබේ.

මෙම ගුවන් විදුලිය තුළ මෑත කාලීනව හතු පිපෙන්නාක් සේ මතුව ආ “එෆ්එම්” නාලිකා රැසකි. තනි අකුරේ, අකුරු දෙකේ හෝ අකුරු තුනෙන් කියවෙන නම් වලින් පිරි එම “එෆ්එම්” නාලිකා ඇතැම් අයට “පොපියන චමත්කාරයකි”. නොඑසේ නම් “හද ගැහෙනා රාවයකි”. කෙසේ හෝ පාරතොටේ, බස් රථයේ, බාබර් සාප්පුවේ, ලොතරැයි කුඩුවේ හෝ වෙළෙඳ සැලේ දී ඇසෙන එකී එෆ්එම් විකාශයන් තුළ ඇති නිසරු වත් පිළිවෙත් අප සමාජයට කොතෙක් ගෝචර වන්නේ දැයි මැනබැලීම වටී.

### ගීත ඉල්ලීම

ගීත ඉල්ලීම් වලට ඇත්තේ එෆ්එම් රේඩියෝ නාලිකාවල ඉහළ ඉල්ලුමකි. එහිදී ගීත ඉල්ලුම් කරන කෙනාට තම හත්මුතු පරම්පරාවේම අයගේ නම් ටිකද, කිසිවක් නොදන්නා අහල පහල අයගේ නම්ද එක හුස්මට පැවසිය හැකිය. සමහර විට මෙසේ කියන නම් අතර, මියගිය අයගේ නම්ද ඇතුළත් වීමට ඉඩ ඇත. කෙසේ වුවද පාර තොටේ බස් රථවල, වැඩපලේ හෝ නිවසේ සිටින සෙසු ශ්‍රාවකයන්ට කිසිවෙකුගේ ගීත ඉල්ලීම් වලට කන්දී, දුරකථන බිල් නොගෙවාම සෑහෙන පිරිසකගේ නාමාවලියක් නොමිලයේම අසන්නට හැකිය. මෙලෙස ගීත ඉල්ලීම් ප්‍රචාරය කිරිමේදී නිවේදකයා විසින් ගීතයේ පද පේලියක් ගායනා කොට ගීතයට පොඩි තල්ලුවක් දෙන අයුරුද සුලභව ඇසිය හැකිය.

“ආ කුසුම්.... කුසුම් කොහෙන්ද කථා කරන්නේ”

“මම දෙහිඅත්තකණ්ඩියෙන් කථා කරන්නේ”

“ඉතින් කුසුම්..... කවුද මේ ගීතයට එකතුකර ගන්නෙ”

“අම්මා, තාත්තා, අයියා, අක්කා, ලොකු පුංචි, පහළ ගෙදර සමන් මල්ලී, උඩ ගෙදර වයලට්, කඩුවෙලින් පොඩි බාප්පා, සමරසිංහ මල්ලී, ආ... තව මැල්සිරිපුර අල්මේදා අංකල්, වජිර පුංචි, චුටි බබා සමීර, ලොකු චුටි ගිම්හාන, සව්දි වල ඉන්න ප්‍රියවති අක්කා, බයරේන් වල නුවන් අයියාත් එකතුකර ගන්නව. ඒ වගේම මේ ගීතය අහන හැමෝමත්, එකතු කර ගන්නව, ඔය දෙන්නවත් එකතු කර ගන්නව”

"හොඳයි බොහොම ස්තුතියි අපිට කථා කළාට. එහෙනම් මෙන්න ඔයාගෙ කැමතිම ගීතය"

"තොල්පෙති විතරක් පළමු හාදුවෙන් තෙමන්න....."

**කන පැලෙන්නට සිංදු**

වැරදීමකින් හෝ පුද්ගලික බස් රථයකට ගොඩ වුවහොත් තමාගේ කැමැත්ත අකමැත්ත කෙසේ වුවද රියදුරුගේ හෝ කොන්දොස්තර තැනගේ අභිමතය පරිදි නොමිලයේ ගීත ඇසීමේ මහඟු අවස්ථාවද මගියාට උදාවේ. එසේම එය සුඛෝපභෝගී බස් රථයක් නම් දොර ජනෙල් වසා ඇති නිසාම කන පැලෙන තරමේ ශබ්දයෙන් එය රසවිඳීමට හැකිය. එම බස් රථයේම ඔබ ගමන් ගන්නේ පැය තුන හතරක් ගතවන දුර ගමනක් නම් බොහෝ විට ඔබට ගීත කටපාඩම් කර ගැනීමේ හැකියාව ලැබේ. මන්ද යත් එම ගමන පුරාම සමහර බස් රථවල එකම කැසට් පටය ඒ පැත්ත මේ පැත්ත හරවා ඇසීමට සලස්වන නිසාය. තවද බස් රථ වල ගමන් කරන ඇතමෙකුට වමනය යාමද සුලභව දැකිය හැකිය. එසේ වන්නේ බස් රථයේ විකාශනය වන එෆ්එම් නාලිකා වල නිවේදක නිවේදිකාවන්ගේ "කන්දොස් කිරියාව" නිසාම වන්නටද බැරි නැත.

**ජංගම රෙකෝඩ් බාර්**

මෑතක සිට ත්‍රීරෝද රථවලද ජංගම රෙකෝඩ්බාර් පවත්වාගෙන යනු පෙනේ. ඕනෑම රාත්‍රියක දී වුව මීටර් 100 ක් 200 ක් තරම් දුරකදී වුව පැහැදිළිව පැමිණෙන්නේ ත්‍රීවිලරයක් බව හඳුණාගත හැකිවන තරමට ඒවායේ ඇති ගුවන් විදුලි යන්ත්‍රයේ හෝ කැසට් රෙකෝඩරයේ හඬ ඇසේ. ත්‍රීරෝද රථ වලට සවිකොට ඇති ඇතැම් කැසට් යන්ත්‍ර, වටිනා කමින් දෙවෙනි වන්නේ එම ත්‍රීරෝද රථයට පමණි. ත්‍රීරෝද රථ තුළ එෆ්එම් නාලිකා වලට අයත් ස්ටිකර් ඇලවීමද අළුත්ම විලාසිතාවකි. එසේම නිතර දෙවේලේ එම නාලිකාව ඇසීම මගින් මුදල් ත්‍යාග පිරිනමන බැව්ද කියවේ. එනිසාම ඇතැම් ත්‍රීවිල් කරුවන් "හයර් " ඇතත් නැතත්, එහි ගමන් ගන්නා මගියාට කරදරයක් වුවත් නැතත් කන පැලෙන සද්දයෙන් රේඩියෝව දමාගෙන යයි.

**ප්‍රවෘත්ති**

අතිශය දියුණු වත්මන් ලෝකයේ පුවත් සන්නිවේදනය ඇසුරු සැනින් සිදුවේ. බීබීසී, සීඑන්එන්, ප්‍රංශ පුවත් වැනි සේවා මගින් ලෝකයේ එහා කෙළවර සිදුවන දේ ඒ මොහොතේම මෙහා කෙළවරේ සිටින්නෙකුට වුවද දැනගත හැකිවේ. ඕනෑම අයෙකුට අන්තරජාලය ඔස්සේ මොහොතින් මොහොත ලෝකයේ සිදුවන වෙනස්වීම් පහසුවෙන් බලාගත හැකිය. මෙවන් වටපිටාවක් තුළ අපගේ පෞද්ගලික ගුවන් විදුලි මාධ්‍ය හැසිරෙනුයේ අමුතුම ආකාරයකටය. ඔවුන් පුවත් සන්නිවේදනය කරනුයේ විශාල ලෙස කේවල් කිරීමකින් අනතුරුවය. උදේ 08.00 තිබෙන ප්‍රවෘත්ති ගැන 07.30 ට ඉඟියක් දේ. එසේත් නොමැති නම් කියනුයේ පුවත් සිරස්තල පමණි. එහිදිද අසන්නට වෙන්නේ ප්‍රවෘත්ති වලට වඩා වෙළෙඳ දැන්වීම්ය. පුවත් සිරස්තල ගෙන එන්නට වෙනම අනුග්‍රාහකයින් සිටී. එයින්ද දේශිය පුවත් ගෙන ඒමට තවත් අනුග්‍රාහක ආයතනයන් සිටී. විදෙස් පුවත් වලට තවත් අනුග්‍රාහයකි. මේ ආකාරයට සම්පූර්ණ ප්‍රවෘත්ති විකාශය අසන්නට නම් ශ්‍රාවකයා ඉහත සියළුම අනුග්‍රාහක භවතුන්ගේ වෙළෙඳ දැන්වීම් කැමැත්තෙන් හෝ අකමැත්තෙන් අසා සිටිය යුතුය. මෙහි තවත් හාස්‍ය ජනක කරුණක් වන්නේ කේවල් කරමින් වරු ගණන් දිගට ඇදගෙන අවුත් විකාශය කරන ප්‍රවෘත්ති වල ඇත්තේද එහෙන් මෙහෙන් ඇහිඳ ගත් තොරතුරක් පමණි. එකම දේ රහ කරමින් එහාට මෙහාට හරවා එය ප්‍රකාශ කරන විලාශය ඇසීමට හිරිකිතය. අනෙක් කරුණ නම් ප්‍රවෘත්ති අනුග්‍රාහකයින්ගේ වෙළෙඳ දැන්වීම් සඳහා විනාඩි 05 ක් පමණ ගතවුවද, ප්‍රවෘත්ති විකාශයටම ගත වන්නේ විනාඩි 02 ක් හෝ 03 ක් වැනි කෙටි කාලයකි.

වේලාව සවස 0630 යි. මේ "මුබ එෆ්එම්" ගුවන් විදුලියයි.

ප්‍රවෘත්ති. මුලින්ම දේශීය පුවත්. දේශිය පුවත් ඔබ වෙත ගෙන එන්නෙ... සැලෝලයිට් බිස්කට් අනුග්‍රාහයෙන්//

...................................

මීලඟට "මුබ එෆ්එම්" විදෙස් පුවත්.
විදෙස් පුවත් ඔබ වෙත ගෙන එන්නේ
ඉටිරෙදි සාරි අනුග්‍රහයෙන්//

...................................

මීලඟට "මුබ එෆ්එම්" ක්‍රීඩා පුවත්
ක්‍රීඩා පුවත් ඔබ වෙත ගෙන එන්නේ
ඔට්ටුපාල් ලේදර් අනුග්‍රහයෙන්//

...................................

මීලඟට "මුබ එෆ්එම්" කාලගුණ පුවත්
කාලගුණ පුවත් ඔබ වෙත ගෙනඒමේ
සමාදර දායකත්වය පටකුඩ ලිමිටඩ්//

**මුදල් ත්‍යාග පිරිනැමීම**

මුදල් ත්‍යාග පිරිනැමීමද දින් දින් මෙම රේඩියෝ නාලිකා වල විලාසිතාවක් බවට පත්ව ඇත. නමුත් ඒ සඳහා පැය දෙක තුන එසේත් නොමැති නම් වරුවක් පමණම එකදිගට ඊට සවන් දිය යුතුය. බිත්තර දමන රන් කුකුල්ලුද, අඩලන කුක්කුං මහත්තුරුද, බෝම්බ සෙල්ලම්ද මේ නාලිකා වල නිමක් නැත. සමහර තරඟ මුළු දවස පුරාම පැවැත්වේ. ඒවායෙන් ජයග්‍රහණය කිරීමට නම් ගෙදරින් එළියට නොබැස සියළු වැඩ කටයුතු පසෙකලා ඊටම සවන් දිය යුතුය. ගෙදර දොර මොන ප්‍රශ්න තිබුණත් ගුවන් විදුලි එෆ්එම් නාලිකා සමග "ෆන්" එකට "සෙට්" විය හැක.

**නිවේදක නිවේදිකාවන්ගේ මුකුළු**

බොහෝ එෆ්එම් ගුවන් විදුලි නාලිකා වල මෙය සුලභව දැකිය හැකිය. මෙය එක්තරා ආකාරයකට නිවේදක නිවේදිකාවන්ට වැළඳෙන රෝගයක් වැනිය. පැය ගණන් එකදිගට විකාශනය කෙරෙන වැඩ සටහන් වලදී මෙම තත්වය කැපී පෙනෙයි. වැඩ සටහන් කිසිසේත්ම අදාල නොවන වල් පල් සියල්ල කිසිදු පැකිලීමකින් තොරව ඔවුන්ගේ අභිමතය පරිදි ගෙනහැර දක්වයි. විටෙක කෙඳිරිගායි. විටෙක කොක් හඬලයි. තවත් විටෙක කොඳුරයි. මුකුළු වල සීමාවක් නැත. කිසිවෙකු හිනා නොවුනත් ඉඳහිට විහිළු තහලුද කරයි. ඔවුන් කියන විහිළු කථා අවසානයේ පටිගත කළ හිනා හඬක් ප්‍රචාරය කරනු ලබන්නේ ඒවාට සජීවී ලෙස කිසිවෙකුට සිනා නොයන බැව් ඔවුන් දන්නා නිසාම විය හැකිය. අදාල වැඩ සටහන් නිෂ්පාදකවරුන්, නිවේදක නිවේදිකාවන්ට මැදිරිය භාරදුන් පසු ඔවුන් කුමක් කියන්නේදැයි නොදනී. එය දන්නේ ඊට සවන් දෙන්නවුන් පමණි.

**ජනප්‍රියම ගීතය**

එෆ්එම් නාලිකාවල ජනප්‍රියම ගීතය තෝරන්නේද මනස්කාන්ත අයුරිනි. දෙතුන් දෙනෙකු ලබාදෙන දුරකථන ඇමතුම් මගින් හෝ එවැනිම වූ පෝස්කාඩ් හෝ SMS පණිවිඩ මගින් ලංකාවේම ජනප්‍රිය ගීතය තෝරා ගැනීමට ඔවුන් දක්ෂය. දෙතුන් දෙනෙකුගේ කැමැත්ත ලංකාවේම කැමැත්ත බවට පත්කිරීමේ විශ්මකර්ම විජ්ජාවක් ඔවුන් සතුය.

දේශාභිමාන ගීත, පැරණි ගීත, විරිඳු, කවි, ළමා ගීත ඇතැම් එෆ්එම් නාලිකා වලට අරහත්ය. "ටොප්" එකේ නැගල යන



"ෆන් එකට සෙට් වෙන" රජගහේ බඩුවලට ඉල්ලුම වැඩිය. කිසිදු වචනයක් නොතේරුනද හින්දි ගීත ප්‍රචාරය වීමට වෙලාවක් කලාවක් නැත. ඇතැම් නාලිකා වල රෑ දෙගොඩ හරියේ සිට එළිවන තුරු ඇසෙන්නේ හින්දි ගීතය. සමහර නාලිකා වල උදෑසන වැඩ සටහන් ඇරඹෙන්නේද හින්දි ගීත වලිනි.

මීට කළකට ඉහතදී අපට අළුයම ගුවන් විදුලි යන්ත්‍රය ක්‍රියාත්මක කළ සැනින් ඇසුනේ පිරිත්ය. නැතිනම් ධම්ම චින්තාව හෝ සියළු ආගමික උතුමන්ලාගේ හරවත් උපදේශයකි. දේශාභිමාන ගීතය, එසේත් නොමැති නම් මව්ගුණ ගීතය. මුලදී නැතත් දැන් දැන් බොහෝ ගුවන් විදුලි නාලිකා වල එම තත්වය දකගත හැකි වීම නම් සතුටට කරුණකි. නමුත් ඇතැම් නාලිකා වල තවමත් අලුයම සිට ඇසෙන්නේ සමහර විට "කඩුවෙල සමන්ති" ගීත ඉල්ලන හඬය. නැතිනම් "පිළිමතලාවේ පුෂ්පලතා" ගීත ඉල්ලන හඬය. එසේත් නැතිනම් "තඹුත්තේගම මහින්ද" හෝ "වැල්ලවත්තේ නවාස්" ගීත ඉල්ලීම් කරන අයුරුය. ඔවුන්ගේ පරම්පරාවල සියළු දෙනාගේ නම් වලින් අළුයම අපගේ දෙසවන් පුරවාගෙන "මෝනින් ෆන්" එක විඳ රාජකාරියට පිටත් විය හැකිය.

එසේම එක ගීතයක් අසන්නට වෙළෙඳ දැන්වීම් දහයක් වත් ඇසිය යුතුය. එය කෙසේ වුවද හරියටම තත්පර ගණනට ගීතය විකාශය කරන්නටද ඔවුහු පොරොන්දු දෙති.

"හරියටම තව විනාඩි 3 යි තත්පර 20 කින් ඔබට එච්ආර් ජෝතිපාලගේ "මහද නමැති වන බඹරා" ගීතයට සවන්දිය හැකිය"

## සංවාද

බොහෝ එෆ්එම් ගුවන් විදුලි නාලිකා වල රසවත් හරවත් සංවාද වලට ඉඩ නැත. ඇත්නම් ඒ ඉතාම අතලොස්සකි. ඉඳහිට කවුරු හෝ ජනප්‍රිය යැයි කියා ගන්නා අයෙකු මැදිරියට කැඳවා කථාබහ කරති. (එය ඔවුන්ගේ භාෂාවෙන් කියතොත් දොඩමළු වීමකි) එහෙත් ඒ සංවාද වලින් කිසිවෙකුට ප්‍රයෝජනයක් නැත. ඇතැම්විට රටම පිළිගත් වැදගත් ක්ෂේත්‍රයන්හි නියුතු වුවන් සංවාද වලට කැඳවුවත් ඔවුන්ගෙන් අසන්නේද තම බිරිඳ හෝ ස්වාමියා හමුවූ හැටි, ආදරය ගැන හිතෙන දේවල්, කෑමට කැමති දේවල්, මේ ආදී කිසිදු වැදගැම්මකට නොමැති ප්‍රශ්නය.

## මුදල් බෙදදීම්

මුදල් බෙදදීම්ද දැන් දැන් නාලිකා වල අලුත්ම මෝස්තරයක් වී තිබේ. (මෙය රූපවාහිනී නාලිකා වලද ජයමට කෙරේ) මුල් අවධියේ ශ්‍රාවකයින් ගුවන් විදුලියට සවන් දෙන ලද්දේ එහි ඇති වැඩසටහන් වල ගුණාත්මක බව හා රසවත් බව සලකාය. නමුත් දැන් ඇතමුන් ඊට සවන් දෙනුයේ පූරුවේ වාසනාවකට හෝ කීයක් හරි ලැබේවී යන සිතුවිල්ලෙනි. ගුවන් විදුලි යන්ත්‍රයේ අදාල නාලිකාව ක්‍රියත්මකව තිබෙද්දී හොර හතුරෙක් දොරට තට්ටු කළද රෑ දේගොඩ හරියේ පවා පැකිලීමකින් තොරව දොර අරින්නට ඇතැම් කාන්තාවන් සැදී පැහැදී සිටිනුයේ අදාල එෆ්එම් නාලිකාවේ මහත්තුරුන් මුදල් බෙදන්නට පැමිණ ඇතැයි සිතාගෙනය. කලකට ඉහතදී ගුවන් විදුලි යන්ත්‍ර පාවිච්චිය වෙනුවෙන් ශ්‍රාවකයින් රජයට ලියාපදිංචි ගාස්තුවක් ගෙවන ලදමුත් දැන් උදාවී ඇත්තේ අදාල ආයතන මඟින් ගුවන් විදුලියට සවන්දීම වෙනුවෙන් ශ්‍රාවකයාට මුදල් ගෙවන යුගයකි. අද එය කොතරම් තරඟකාරි ලෙස ව්‍යාප්තව ඇති දැයි කියතොත් ඇතැම් නාලිකා වලට අයත් පුද්ගලයින් නිවෙස් වලටම ගොස් රුපියල් දහයි... දෙදහයි... තුන්දහයි... ආදී වශයෙන් මුදල් බෙදද්දී, එවැනිම තවත් නාලිකාවකට අයත් පුද්ගලයින් මහමගදී හෝ බස් රථවලට ගොඩවී රුපියල් පන්දහයි... දහදහයි... පහලොස්දහයි... අදී වශයෙන් මුදල් තොග වශයෙන් අහල පහළ සැමටම බෙදන්නට පෙළඹී ඇත්තේ "නම" කිව්වොත් සල්ලි තමයි යනුවෙනි. නමුත් මෙහි අවාසනාවන්ත තත්ත්වය නම් මෙතරම් අතදිගහැර වියදම් කිරීමට මුදල් එම ආයතන සතුවෙද්දීත් ගංවතුර නායයෑම් ආදී හදිසි අවස්ථාවලදී ජනතාවට බෙදා දෙන්නට මුදල් හෝ ද්‍රව්‍ය ආධාර ඉල්ලා එම ආයතන ජනතාවටම කරදර කිරීමයි.

කෙසේ හෝ ඇතැම් එෆ්එම් නාලිකා හරහා සමාජයට රටට අතිමහත් මෙහෙයක් ඉටුවන බවද මෙහිලා සඳහන් කල යුතුමය. ගුවන් විදුලි ආචාරධර්ම ආරක්ෂා කර ගනිමින් සමාජ හරපද්ධතීන්ට හානි නොවන සේ කටයුතු කරන්නට එම ආයතන ඉදිරිපත්ව සිටීම පැසසිය යුත්තකි. එසේ නොවන ඇතැම් ගුවන් විදුලි මාධ්‍ය ආයතන හුදු වෙළෙඳ අරමුණු සහ පහත් රුචිකත්වය පදනම් කර ගනිමින් අපගේ භාෂාව සංස්කෘතිය අමුඅමුවේ විනාශ කිරීම අපරාධයකි. වර්ථමානයෙහි සාම්ප්‍රදායික රේඩියෝ කලාව වෙනසකට භාජනය වී ඇතත් අවාසනාවකට එය වැඩිපුර බරවී ඇත්තේ ගුණාත්මක නොවන පැත්තටය. හුදෙක්ම මෙවැනි ලිපිවල අරමුණ වනුයේ එකී ගුවන් විදුලි ආයතන නිර්ධය ලෙස විවේචනයට ලක් කිරිම හෝ ඒවාට අපහාස කිරිම නොවන අතර, සමාජය තුළ ඒ පිළිබඳව ඇති නොසන්සුන්තාව එම ආයතන අවබෝධ කරගනු ඇතැයි යන විශ්වාසයෙනි. ඉල්ලුමට අනුව සැපයුම පදනම් කර ගනිමින්, ඉල්ලන ඕනෑම දෙයක් දෙනවා වෙනුවට, යහපත් හරවත් ඉල්ලුමක් සමාජය තුළ නිර්මාණය කොට ඊට අනුකුලව සැපයුම ලබාදෙන්නට සියළු එෆ්එම් නාලිකාවන් උනන්දු වන්නේ නම් කොතරම් අගනේද? අගාධයකින් වැටි මිය යාමට ආසන්න වෙත්ම කකුල වන වනා "ෂපාන් එකේ" මිය යාමට ඉඩ හැරීම වෙනුවට අවසන් මොහොතේ පරඬැලක එල්ලී හෝ ඉන් ගොඩ ඒමට උනන්දු කරවීම නොවටිද?

මේ ලිපියේ ඉතිරි කොටස හරියටම තව විනාඩි 27 කින්

එතෙක් ඔබට මේ ලස්සනම... ලස්සනම ... ලා..ස්..ස..න..ම ආදර ගීතය.

"කුචු කුචු හෝතාහේ"

මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ

කවි

# උල්පත



## යෞවනය හා දුම්රිය

උතුරලා යෞවනේ රස පිරෙන මල් පැතුම්
පතුරලා සෙනේ සිත් එක් කරන් මිතු දමේ
සනසලා මව්පියන් පෙන්වමින් බොලඳ කම්
ලංවෙලා සවනට ... කරයි පෙම්

ඈත ක්ෂිතිජය ඉමේ බසින හිරු සැඟවිලා
මෑත මඳ අඳුර හා රැහැයි හඬ මුහුවෙලා
දෝත පා පිළිගන්න යකඩ යකු පියඹලා
මෑත හඬ නෑසුනිද සවන් යුග තෙරපිලා

නිමවුනිද පන්තියක ලබන අමතර දැනුම්
සිහිවුනිද සාදයක රඟන මිහිරැති රැඟුම්
සිරවුනිද යුග සවන ගීතයක රස හැඟුම්
නිමවුනිද දිවි ගමන අතර දුම්රිය ගමන්

පාද තබමින් හෙමින් යෙහෙලියක හා එක්ව
නඳ අසමින් සවන් දුරබනුව හා ලංව
සාද සතුටින් යකඩ පීලි බව අමතකව
වාද කර පලක් නැත ජීවිතය අවසන්ව

යොවුන් විය සොඳුරුමැයි නොමැත ඒ ගැන වාද
බවුන් වඩනට නොහැක කෙලි කවට සිනා මැද
සවන් දී දැස් හැර මඟ හොඳින් බලා හිඳ
තමන් ගෙත් අනුන්ගෙත් දිවිය ගැන සිතනු සඳ

**නිමිත්ත සවන් ආධාරයක් මගින් ගී අසමින් දුම්රිය මඟ දිගේ සාදයට ගිය මිතුරිය දුම්රියට බිලි**

**පීඒ දීප්ති නිල්මිණි**
**පිලිකුත්තුව**

## සෙබළ බිරිඳට

දයාබර සොඳුරිය
නුඹේ ජීවන ගමනට
පහන් ටැඹක් වෙන්නම්
මා මියෙන තුරු...
සැමදා නුඹ ලඟින්
හිඳින්නට වරම් නොලැබුණිද...
මා සිත රජ කරන්නේ
නුඹේ රුවමය සැමවිට...
සයුරේ නැගෙන රැල්ලක්
වෙරළට ගලාවිත් එය සිප ගන්නාසේ
ලද සැනින්ම දිව එමි මම නුඹව
සිප සනසන්න...
මව්බිම රැකීමට
නුඹද ලැබදෙන
සවිය මට සවියකි
බිරිඳක් විලසී

**සෙ/16එච්00386**
**ලා/කෝ උපතිස්ස ඩබ්ලිව්ජී**
**16 (සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුව**

## නවකතාවක් වගේ

අතීතය නවකතාවක් වගේ
කියවගෙන යන්න
මතක නෑ තමයි
ඒත් ඒ කටහඬ
ඒ මුහුණ
හිත ඇතුලේ
තාමත් රිදෙනවා...
පටන් ගන්න තැන
ඉවර කරපු තැන
කියන්න මතක නෑ තමයි...
ඒත් හැරදා ගියහැටි
අදවගේ මතකයි...

**සෙ/19කිපු00243**
**කෝප්‍රල් නන්දසේන එච්ඒ**
**19 ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුව**

## හැඟුම් බර මතකයේ 25 වන හෘදයාංගම ආවර්ජනය



නොසැලුණ ගුණය එඩිතර ගති පිරුණු රණ
නොනැමුණ දෙදණ ඉදිරියෙ පර සතුරු විණ
නොදනුන සුවය නිදහස මිස නොමැති වෙන
නොනිමෙන සිල නුඹයි දැල්වුන හතර කොන


නමුණු කුළ කඳු මුදුන තරමට තෙජස අබිමන පින පිරූ
දැමුණු අතුගා සතුරු බළමුළු මහ පොළොවෙ පස් යට කෙරූ
ගැමුණු ගජබා පරපුරෙන් යළි ඉපිද ගෙන අසිපත හුරූ
නිවුණු දැය පණ පොවනු කොබ්බෑකඩුව සෙන්පති රණවිරූ

**මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ**

**1992 අගෝස්තු 08 වන දින යාපනය අරාලි තුඩුවෙහිදී බිම් බෝම්බයකට හසුව දැයෙන් සමුගත් මේජර් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව යුධ සෙන්පති වෙනුවෙනි ....**

# රණවරුණ...ට
# ඔබේ ලිපි නිර්මාණ ඕනෑ




### කවි නිසඳැස්
සඳැස් කවි නම් උපරිමය පැදි අටකට සීමා කරන්න. නිසඳැස් නම් උපරිමය පේළි 10 - 15 කට සීමා කරන්න.

### විශේෂාංග ලිපි
උපරිමය තනි පැත්තේ ලියන ලද A.4 ප්‍රමාණයේ පිටු දෙකකට සීමා කරන්න. (නිර්මාණයේ ගුණාත්මක භාවය සළකා බලා අමතර ඉඩකඩ වෙන් කිරීම සිදුකෙරේ)

### ඒකක තොරතුරු
සංක්ෂිප්ත කර අදාළ තොරතුරු පමණක් එවීමට කටයුතු කළ යුතු අතර, ඊට සම්බන්ධ ඡායාරූප එවීමේදි සිදුවීමට අදාලව පැහැදිලි ඡායාරූප එවීමට වගබලා ගන්න.

යුද හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානය මගින් ප්‍රකාශයට පත්කරණු ලබන "රණවරුණ" සඟරාව වර්තමාණයේ යුද හමුදාව තුළ ඉහලම ජනප්‍රියත්වයක් දිනා ඇති සඟරාව බව නිරතුරු අප වෙත ලැබෙන ලිපි හා දුරකථන ඇමතුම් මඟින් සනාථ වේ. එබැවින් රණවරුණ එම තැනට ඔසවා තැබූ ඔබ සැමට අපගේ ගෞරවණීය ආචාරය මෙලෙස පුදකෙරේ.

ස්වේච්ඡා බලසේනාවට අයත් ඒකකවල තොරතුරු හා එහි සාමාජිකයින්ගේ නිර්මාණාත්මක හැකියාවන් සඳහා වැඩි ඉඩකඩක් මෙම සඟරාව තුළ වෙන්කලද බොහෝදෙනෙක් ඉන් උපරිම ප්‍රයෝජන නොගන්නා බැව් නිරීක්ෂණය වේ. විශේෂයෙන්ම බොහෝ ඒකක නිරතුරු අප වෙත ලිපි නිර්මාණ යොමු කළද ඇතැම් ඒකක එසේ ලිපි නිර්මාණ එවනු ලබන්නේ ඉතා කලාතුරකිනි. ඒ අතරින්ද කිසිදු තොරතුරක් යොමු නොකරන ඒකකද වේ.

සෑම ඒකකයක්ම පාහේ නිරතුරු ඉතා වැදගත කටයුතු ඕනෑ තරම් සිදුකරනු ලබයි. නමුත් එම තොරතුරු මෙම සඟරාව වෙත ලබා නොදිම හේතුවෙන් කිසිවෙකු එම තොරතුරු ගැන දැනුවත් නොවන තත්වයක් මතුවේ. එබැවින් ඒ පිළිබඳ අවදානය යොමුකර ඒකකය තුළ සිදුවන වැදගත් තොරතුරුද සෙබල සෙබලියන්ගේ නිර්මාණද නොපමාව අපවෙත යොමු කරන්න.

### රණවරුණට ලිපි එවීමේදි
"රණවරුණ" යුද හමුදාවේ ප්‍රකාශනයක් බැවින් ඔබ එවන ලිපි නිර්මාණ ඊට ගැලපෙන ඒවා විය යුතුය. විශේෂයෙන්ම යුද හමුදාවේ ප්‍රථිරූපයට හානිවන හෝ සෙබළුන්ගේ චිත්ත ධෛර්ය බිඳවැටෙන නිර්මාණ නොවිය යුතුය.

### ඡායාරූප එවීමේදි
ඡායාරූප JPEG ලෙස එවීමට කටයුතු කළ යුතු අතර, උදා: Excel, Power Point හා Word යන මෘදුකාංග තුළ ඡායාරූප අතුලත් කර එවීමෙන් වලකින්න. තවද ජංගම දුරකතන මගින් ගනු ලැබූ ඡායාරූප එවීමේදි එහි ගුණාත්මක භාවය කෙරෙහිද සැලකිලිමත් විය යුතු අතර, එසේ ලබාගන්නා ඡායාරූප වැඩි ධාරිතාවයකින් යුත් ඡායාරූප විය යුතුය.

සියලුම ඡායාරූප JPEG ලෙස (Resolation 300) හා අකුරු (Font) FM/DL වලින් පමණක් එවන්න. (උදා: FMAbhaya, FMEmani) තවද "ඉස්කෝල පොත, Kandy හෝ SandyaBOI" වර්ගයේ Fonts භාවිතා නොකරන්න.



# කවි

# උල්පත



## අපි ජය ගනිමු දැය ඔබගේ මගේය

දිවි මග කොතෙක් තිබුනත් බිහිසුණු වංගු
රිදුමේ කෙඳිරියෙන් සුව සහනය හැංගු
සිය දහසක් පිරිස මරු තුරුළට රිංගු
අද ඉදිරියට විත් ඇත සතුරා "ඩෙංගු"

එකමුතු සවිය අදිටන අරමුණට හැරී
සුවපත් කරන්නට මුළු දැය කොහොම හරී
පිරිසිදු කළොත් පරිසරයම රැගෙන දිරී
උවදුරු "ඩෙංගු" මැඬලන්නට කිමද බැරී

අවසන් වුණු නමුදු තිස් වසරක යුද්දේ
අපලය රෝග වාහකයන් ගෙනි ලද්දේ
රණවිරු පිරිස පසුවෙති මෙහෙවර මැද්දේ
ජයගෙන සටන පතුරමු කාහළ සද්දේ

දරු පරපුරට හිමි හෙට හිරු නගින රට
ඇත වගකීම සුරකින්නට ඔබට මට
ගොස් ඉදිරියට නොපමාවම සියලු විට
වැටකොටු බඳිමු විසකුරු මදුරුවෙකු හට

ලියලන නමුත් ගහ කොළ වැල් හැඩ රුවට
ඇත නෙක බරිත දේ විනකරවන ලොවට
තබමින් පිරිසිදුව ගේ වතුපිටි අවට
සුවපත් කරමු අමනා වියදම් මවට

දුක් මුසු පුවත් දැක කරවන ළය සසල
පසුවිය යුතු නොවේ වී තවමත් නිසල
නිසිලෙස ඉවත් කරමින් හැම කැළි කසල
සුව වින්දනය පතුරමු හිරු සඳු අසල

සතුරා කොහෙද සැඟවුනු බව හැගේය
එක්සත් කමේ අවි සටනට අගේය
රජයෙත් රටෙත් අරමුණ එක වගේය
අපි ජය ගනිමු ජය ඔබගේ මගේමය

**කොස්කඳවල නන්දසේන වීරසිංහ**

## සෙනෙහසක අරුත

මග වැරදි යන බව දැකලා
නුඹේ නොවන පොඩි වුන්ට
කියා දුනි මග
පුන් සඳක් සේ පෙරදා...

ඒ සඳ උන්ගෙන්
ඈත්වීලා
යන සඳ
උන් හඬයි
ඉකි ගසලා
නුඹේ දෙපා මත
නළල රුවාගෙන
නුඹට ඇති
සෙනෙහස නිසා

**සෙ/එච්101085**
**සාසෙ රණසිංහ යුපීඒපී**
**16(සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුව**

## මා ණය ගැතිය නුඹට

මුළු දිවිය පුරා
දස මසක් කුස දරා ...
ලේ කිරි කර පොවා
අනේක විඳ
දුක් කම්කටොලු විඳ.....
දහසකුත්
බලාපොරොත්තු කැටුව
මා මෙලොවට බිහිකළ
මගේ දයාබර මෑණියනි...
මා ණය ගැතිය නුඹට
මේ මුළු දිවිය පුරා...



**සෙ/එල්100181**
**සාසෙ සත්‍යා ජයන්ත පීජේ**
**2(සෙව්)ශ්‍රීලයුවෙබ**

## ප්‍රේමය නම්

එක් වුවෝ පසු කලෙක
උනුන් රිදවා ගනිති
බිඳෙති වෙන්වෙති
එක් නොවුවෝ සදාකල්හිම විඳවති
එහෙත් කිසි කලෙක
නො බිඳෙති වෙන් නොවෙති

බැඳුණු අතැඟිලි වලට වඩා
බැඳුණු සිතුවිලි ප්‍රේමාන්විත බව
ලෝකයට කියන්නට
ඔවුන් උත්සාහ නොකරති
එක් වුවෝ ලයගින්නේ යහන්ගත වෙති
එක් නොවුවෝ හද සයනේ යෙහෙන් වැජඹෙති
ප්‍රේමය නම්
එක් වුවන්ගේ
රජ දැක්ම නොවේ
ප්‍රේමය නම්
එක් නොවුවන්ගේ
හද ගැස්මයි

**සෙ/2අර්02847**
**කෝප්‍රල් ධර්මදාස ඩීඑන්එම්**

## නුඹ ඉඳින්....

සඳක් නිදනා යමක,
සිතින් මියැදෙන තැනක,
සිතක් තනිවී සැලෙන,
මේ නිශා යාමයක...

නොදන්නා ඉසව්වක..
තල් කඳක පිටදී හිඳ,
නිදි නොමැති ඇස් වලින්,
අඳුරු කොන් පිරික්සන...

බිරිඳ දරු දෙමාපිය...
කිසිවෙකුත් නොමැති මට...
තුරුල් වී පපු මැදට...
සෙනෙහසින් මගෙ ළඟම...
නුඹ ඉඳින් රයිෆලය...

**සැරයන් තිලක් කුමාර**
**(විශ්‍රාමික)**
**ශ්‍රී ලංකා පාබල හමුදාව**



# විද්වත් වෘත්තික නිළධාරීන්ගේ
# වාර්ෂික පුහුණු කඳවුර

යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව වෙත බඳවා ගනු ලැබූ විද්වත් වෘත්තික නිළධාරින් සඳහා වූ පුහුණු කඳවුරක් ඉකුත් මැයි මස 13 දින සිට 16 දින දක්වා දියතලාව ස්වේච්ඡා පුහුණු පාසලේදී පැවැත්විණ. අදියර දෙකක් යටතේ පැවැත්වෙන මෙම පුහුණු වැඩසටහනෙහි පළමු අදියරට නිළධාරීහු 45 දෙනෙක් සහභාගී වූහ. එහි අවසන් අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් එම්එච්එස් බොනිෆස් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී එක්වූ අතර පුහුණුව අවසානයේ එකී නිළධාරින් වෙත සේනාවිධායක අතින් සහතික පත්‍ර ප්‍රධානයක්ද සිදුකෙරිණ.















# ඩෙංගු
## මෙහෙයුමට සැරසෙමු

අද වන විට අපේ රටේ "ඩෙංගු" වසංගතයක් බවට පත්වෙලා. කලකට ඉහතදී තිබුණු ත්‍රස්තවාදය වගේම මේ ව්‍යසනය හමුවේත් සියලුම ජාතින් පීඩනයට පත්වෙලා. ඩෙංගු හැදෙන්නෙ මදුරුවන් ගෙන් උනාට මදුරුවො හැදෙන්නෙ අපෙත් දායකත්වය ඇතිවයි. දැන හෝ නොදැන ඍජු ව හෝ වක්‍රව හැමෝම ඒකට සම්මාදම් වෙනව. ඒ නිසා මේ උවදුරෙන් ගොඩ එන්න කටයුතු කරන එක කාගෙ කාගෙත් වගකීමක්. හමුදාවේ අපිත් කඳවුරු මට්ටමින් මේ ඩෙංගු වලට එරෙහි සංග්‍රාමය අරඹන්න ඕනෙ. ඒ වගේම එය ජාතික මට්ටමට ව්‍යාප්ත කරල සමස්ථ රටම එකතුවෙන වැඩ පිලිවෙලක් ක්‍රියාත්මක කරන්නත් ඕන. තිස්වසරක් මෙරට පැවති ත්‍රස්තවාදය සදහටම අවසන් කරන්න පුලුවන් වුනේ අපි එකාවන්ව පෙළගැහිල කටයුතු කල නිසයි. ඩෙංගු වසංගතයත් සදහටම තුරන් කරන්න නම් අපි ඒ ආදර්ශය මත පිහිටල කටයුතු කරන්න අවශ්‍යයි. පුංචි මදුරුවෙකුට රටක් වටින පීවිත බිලිගන්න කොහෙත්ම ඉඩදෙන්න බැහැ. හමුදාවෙ අපි ඊට එරෙහිව පෙරමුණ ගනිමු ...









Cover By - L/Cpl Keerthirathna AHTSS